# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,858 — 1969 ජූනි 13 වැනි සිකුරාදා — 1969.6.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 965 | ආණ්ඩුවේ නොවන දැන්වීම් | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 975 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 981 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | 1003 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | 1005 |
| බඩු බාහිරාදිය විකිණීම් | 1003 | විවිධ දැන්වීම් | — |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 6ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවීවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය :

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා වැඩස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක.) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික ;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්.

(සැලකිය යුතුය.—දනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡෙදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.)

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදාල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ජේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසානය දිනය පසුවී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට ඇයට අහිමිවනු ඇත.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

1969 ජූනි මස 6 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා අයදුම් පත්‍රය

(සාප/5/77)

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයක්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.
(ආ) උපන් දිනය '—
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න.)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
(ආ) විවාහක නම්, (i) විවාහ වූ දිනය :————.
(ii) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත් නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමග :—
(අ) සිංහල '————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහහෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර—(අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න: ————

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේ ද ?
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

11. නිවේදනයේ 3 (iii) ජේදයේ සඳහන් පරිදි තමා දක්ෂතාවක් දක්වන වෘත්තීන් මොනවා ද ? :————.

12. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

13. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද ? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

14. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණ ද ? :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නො කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත භටයෙක් නම්, (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටී රැකිරක්ෂා :—
(i) දරන ලද තනතුර :————.
(ii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.
(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදීසිට, එම සේවය යම් අවස්ථාවකද නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දනට යෙදී සිටින රක්ෂාව—ආයතනය/දෙපාර්තමේන්තුව :————.
(i) (අ) තනතුර, ශ්‍රෙණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිත ද ? තාවකාලික හෝ අනියම් ද ? :————.
(iii) (දීමනා රහිතව) දනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය:————.
(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

19 ඉල්ලුම් කරන ශිල්ප ප්‍රදර්ශක වෘත්තිය :————

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුව හොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

දිනය :————    ————, අයදුම්කරුගේ අත්සන.

## පරිපාලන අභ්‍යාස ආයතනය

### ආචාර්ය හා පර්යේෂණ කාර්ය මණ්ඩලය

අභ්‍යාස හා පර්යේෂණ කටයුතු ආශ්‍රිතයන්ගේ තනතුරු සඳහා පරිපාලන අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි ඇබෑර්තු තිබේ. මීට අදාළ කටයුතු නම් :—

(අ) රාජ්‍ය අංශයේ පුහුණු කිරීමේ අවශ්‍යතාවන් දැන හඳුනා ගැනීමේදී පරිපාලන අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂට සහාය වීම.

(ආ) පරිපාලන අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ විසින් පවරනු ලබන අන්දමට කළමනාකාරිත්වය පිළිබඳ විශේෂිත ක්ෂේත්‍රයන්හි පුහුණු කිරීමේ සහ/හෝ පර්යේෂණ කටයුතුවල නිරතවීම.

(ඇ) පවරනු ලබන විශේෂිත ක්ෂේත්‍රයන්හි අධ්‍යාපන ද්‍රව්‍ය වැඩි දියුණු කිරීම.

(ඈ) දෙපාර්තමේන්තු/සංස්ථා/අමාත්‍යාංශ හා වෙනත් රජයේ නියෝජ්‍යතන්වයන් විසින් ආරම්භ කරනු ලබන පුහුණු කිරීමේ වැඩ පිළිවලවලදී සහාය වීම.

(ඉ) පවරනු ලබන විෂයයන් පිළිබඳ ලිපි පොත්පත් ආදිය ප්‍රකාශනය සඳහා පිළියෙල කිරීම.

වැඩවල ස්වභාවය, රාජ්‍ය අංශයේ මාණ්ඩලික ශ්‍රේණිවල සාමාන්‍ය වැඩ පිළිබඳ සම්බන්ධයට අනුව "සම්ප්‍රදාය විරහිතය". සාමාන්‍ය වශයෙන් "ශාස්ත්‍රීය අංශයේ ජීවිතය" හා වඩාත් සම්බන්ධ කට යුතු කිරීම ඊට අදාළ වේ. ආයතනයේ දැන් වැඩ කරන වේගයට අනුව, තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් ඔවුන් වෙත පවරනු ලබන වැඩ හා අධ්‍යයන කාර්යයන් වෙනුවෙන් සතියකට දවස් 6 කදී අඩුම වශයෙන් දිනකට පැය 10 ක් වෙන් කිරීමට කැමතිව සූදානම්ව සිටීම අවශ්‍ය වේ.

ඉගැන්වීමේ හා පර්යේෂණ කටයුතු සඳහා දිවයින පුරා සංචාරය කිරීමද තනතුරින් බලාපොරොත්තු වේ.

තෝරා ගනු ලැබූ අයදුම්කරු යෝග්‍ය බව ඔප්පු වූ විට ඔහුට විශේෂ වූ ක්ෂේත්‍රයන්හි විශේෂ අධ්‍යයනය සඳහා විදේශයන්ට යැවීම සඳහා සලකා බලනු ලැබේ.

දැනට පහත සඳහන් ක්ෂේත්‍රයන්හි අභ්‍යාස හා පර්යේෂණ කටයුතු ආශ්‍රිතයන් බලාපොරොත්තු වෙයි—

(අ) මෙහෙයැවුම් පර්යේෂණ හා කාර්ය අධ්‍යයනය.

(ආ) ද්‍රව්‍ය හා සැපයුම් කළමනාකාරිත්වය.

(ඇ) අලෙවි කළමනාකාරිත්වය.

(ඈ) සංවර්ධන ආර්ථික විද්‍යාව.

(ඉ) රාජ්‍ය මුදල්.

(ඊ) පොදු කළමනාකාරිත්වය.

(උ) වැඩ සටහන් සම්පාදන ශිල්පීය ධර්ම.

**සුදුසුකම්.**—අයදුම්කරුවෝ රාජ්‍ය අංශයේ මාණ්ඩලික ශ්‍රේණිවල අවුරුදු 5 ක අඩුම සේවයක් ඇති නිලධාරීන් විය යුතුය. ඔවුන්ට පිළිගත් විශ්ව විද්‍යාලයක යෝග්‍ය උපාධියක් හෝ සමාන සුදුසුකමක් තිබිය යුතුය.

ඉගැන්වීමේ සහ/හෝ පර්යේෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද මෙන්ම පශ්චාත් උපාධි සුදුසුකම්ද ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්කරුවන්ගේ වයස 1969.6.13 වැනි දිනට අවුරුදු 25 ට වැඩි හා අවුරුදු 45 ට අඩු විය යුතුය.

**සේවා කොන්දේසි.**—පුහුණුවීමේ කාල පරිච්ඡේදයෙන් පසු අවුරුදු 6 ක කාල පරිච්ඡේදයක් පරිපාලන අභ්‍යාස ආයතනයෙහි සේවය කරන බවට ගිවිසුමකට අත්සන් කිරීමට තෝරා ගනු ලැබූ අයදුම්කරුවෝ සූදානම් විය යුතුය. ඔවුන්ට දැනට ලැබෙන වැටුපට අතිරේකව රු. 200 ක වාර්ෂික දීමනාවක් ගෙවනු ලැබේ.

**අයදුම්පත්.**—ආදර්ශ අයදුම්පත් ආකෘතියක් යටින් දක්වා ඇත. අයදුම්පත් 69.6.30 දිනට හෝ ඊට පළමු පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ වෙත ලැබෙන ලෙස සාමාන්‍ය මාර්ගයෙන් මගින් එවිය යුතුය.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ.

### අයදුම්පත් ආකෘති පත්‍රය

1. නම (අන්තිම නම) :————.
   (අනිත් නම්) :————.
2. උපන් දිනය :————.
3. සේවය හා පන්තිය (හෝ තනතුර) :————.
4. රාජ්‍ය සේවයේ රැකියා ඉතිහාසය :————.
5. ශාස්ත්‍රීය සුදුසුකම් :————.
6. පුහුණු කිරීම හා පර්යේෂණ කටයුතු පළපුරුද්ද පිළිබඳ විස්තර :————.
7. විදේශ සංචාරයන් පිළිබඳ විස්තර :————.
8. භාෂා ප්‍රවීණතාව :————.
9. කාර්ය ක්ෂේත්‍රය හා අයදුම්කරු ඇලුම් කරන විෂයයන් : ————.
10. ආයතනයේ කාර්ය මණ්ඩලයට බැඳීමට වුවමනාවී ඇත්තේ කවර කරුණු නිසාද ? :————.

............—.................. මහතාගේ/මහත්මියගේ/මෙනෙවියගේ අයදුම්පත මම නිර්දේශ කරමි/නොකරමි.

.......................... මහතා/මහත්මිය/මෙනෙවිය තෝරා ගනු ලැබුවහොත් මේ වැඩ කොටස භාර ගැනීම සඳහා මුදා හරිනු ලැබේ.

.............................. අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

6–311—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### සිංහල/දෙමළ භාෂා පරිවර්තන තනතුර (අනියම්)

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. පහත දැක්වෙන ආකෘතියේ ප්‍රකාර ඉල්ලුම්පත් 1969.6.30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ආගමන හා විගමන පාලක, තැ. පෙ. 586, ගල්බොක්ක, කොළඹ 1, ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "සිංහල/දෙමළ භාෂා පරිවර්තක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. **සුදුසුකම්.**—(අයදුම් කරුවන්ට පහත සඳහන් සුදුසුකම්වලින් අඩු වශයෙන් එකක් හෝ තිබිය යුතුය).

(1) (i) ලන්ඩන් විශ්ව විද්‍යාලීය අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) සිංහල හෝ දෙමළ විෂයක් වශයෙන්,

(ii) ලංකා අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) සිංහල හෝ දෙමළ,

(iii) උසස් පාඨශාලා සහතිකය සිංහල හෝ දෙමළ (විශේෂ සිංහල/විශේෂ දෙමළ නොවේ). විෂයක් වශයෙන්,

(iv) ලන්ඩන් විශ්ව විද්‍යාලයේ කලා මධ්‍යම සහතිකය, ලංකා විශ්ව විද්‍යාලීය සාමාන්‍ය කලා යෝග්‍යතා (පළමු වැනි) විභාගය සිංහල හෝ දෙමළ විෂයක් වශයෙන්,

(v) මහා භාණ්ඩාගාරයේ සිංහල/දෙමළ ප්‍රවීණතා පරීක්ෂණයේ (ඉහළ පෙළ) සාමාර්ථය සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යාපන පොදු සහතිකපත්‍ර විභාගය (සාමාන්‍ය පෙළ) හෝ ඊට උසස් විභාගයකින් දෙවැනි භාෂාවට (එනම් සිංහල/දෙමළ) අඩුම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(2) 1969 ජූනි 1 වැනි දිනට වයස අවුරුදු 19 කට නොඅඩු අවුරුදු 40 කට නොවැඩි විය යුතුය.

(3) අයදුම්කරුවන් ලාංකිකයින් විය යුතු අතර, විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

4. **සේවා කොන්දේසි.**—තෝරා ගනු ලබන අයදුම්කරු හුදෙක්ම අනියම් පදනමක් මත පත් කරනු ලැබේ. මෙම පත්වීම රජයේ හෝ යම් ආයතනයක ස්ථිර හෝ තාවකාලික රක්ෂාවකට කුමන අන්දමේ හෝ විශේෂ හිමිකමක් ඇති නොවේ. ස්ථිර පත්වීමක් කළ විගසු හෝ ඔහුගේ/ඇගේ සේවය අනවශ්‍ය වූ විටෙක සේවය අවසන් කරනු ලබන අතර, අනතුරුව නැවත රක්ෂාව සඳහා භාණ්ඩාගාර (එක්ස්) ශාඛාවේ ලියා පදිංචි වීමට ඔහුට/ඇයට කිසිදු අයිතිවාසිකමක් නොමැත.

වැඩ කරන එක් දිනකට රු. 5 ක වැටුපක් ගෙවනු ලැබේ. එක් මාසයක් තුළදී උපයා ගන්නා ලද මුළු වැටුප මත විශේෂ ජීවනාධාර සහ ජීවන වියදම් දීමනාව ආදිය ආණ්ඩුවේ ප්‍රමාණයක් මත ගෙවනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
ආගමන හා විගමන පාලක.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 586, ගල්බොක්ක පාර,
කොළඹ 1
1969 ජූනි 2 දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

**සිංහල/දෙමළ භාෂා පරිවර්තක තනතුර (අනියම්)**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.

(ලාංකිකයෙකු වූ හෝ (අ) පෙළපතකින් ද, නැති නම් (ආ) ලියා පදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියා පදිංචි වීමෙන් නම් පුරවැසි සහතිකයේ විස්තර සපයන්න.)

4. (අ) උපන් දිනය සහ දැනට වයස :————.

(ආ) විවාහක, අවිවාහක තත්ත්වය :————.

5. අධ්‍යාපන සුදුසුකම් සහ සමර්ථවූ අන්තිම විභාගය දිනය සහිතව :————.
6. කලින් පළපුරුදුකම් තිබේ නම් :————.
7. දැනට කරන රැකියාව :————.
8. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියක දී වරදකරු වී තිබේද ? :————.

(එසේ නම් විස්තර සපයන්න.)

9. ඔබගේ චරිතය සහ හැසිරීම සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමට හැකි තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපින යන් සඳහන් කරන්න :————.
10. විශේෂ සුදුසුකම් තිබේනම් :————.

ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව, මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව දැනගත හොත් වන්දි ගෙවීමක් නොමැතිව සේවයෙන් පහකර දැමීමට හැකි බවත් මා දන්නා බව මෙයින් සඳහන් කරමි.

————,

ඉල්ලුම්කරුගේ අත්සන.

6–361—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

**පුරප්පාඩු**

සිවිල් ඉංජිනේරු තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

(අ) එම්.අයි.සී.ඊ.* (සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ඇති අය කෙරේ වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.) සහ

(ආ) විශාල ඉදිකිරීම් සහ ~~සිමෙන්~~ කල්මනාකාරිත්වය පිළිබඳ හය මසක පශ්චාත් උපාධි පළපුරුද්ද හෝ එම්.අයි.සී.ඊ. ලැබීමෙන් පසුව අවුරුද්දක පළපුරුද්ද.

*වත්මාන එම්.අයි.සී.ඊ. සහතිකය පෙර පැවති ඒ.එම්.අයි.සී.ඊ. වලට සමාන වේ.

**වැටුප් ක්‍රමය :**

රු. 1,000—1,500 (50×10).

**වයස :**

අවුරුදු 30 කට නොඅඩු විය යුතුයි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 ජූනි 25 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "සිවිල් ඉංජිනේරු තනතුර" යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 ජූනි මස 4 වැනි දින,
කොළඹ 7.

### ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. අයදුම්කරු උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

1969.6.25 දිනට වයස : අවු :————, මාස :————, දින :————.

5. අයදුම්කරු උපන් ස්ථානය :————.
6. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
7. අධ්‍යාපන සුදුසුකම් :—

සිංහල :————.

දෙමළ :————.

ඉංග්‍රීසි :————.

8. කාර්මික/වෘත්තීය සුදුසුකම් :————.
9. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නාම සහ ලිපින : ————.

(අධ්‍යාපනික සහතික සහ චරිත සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

10. ඉහතින් යෙදී සිටි රැකියා පිළිබඳ විස්තර :————.
11. වෙනත් සුදුසුකම් :————.

මා ඉහත ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි සත්‍ය තොරතුරු බවත් මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත්වුවහොත් ම විසින් ඉහත දෙන්නට යෙදුණ අසත්‍ය හෝ වැරදි තොරතුරක් වෙතොත් එම හේතුවෙන් සේවයෙන් පහකිරීමේ දඬුවම ලැබීමට මා සුදුස්සකු වන බවත් විශේෂයෙන්ම මීට පෙර රැකියාවල් පිළිබඳ හෝ මීට අදාළ වැදගත් කිසියම් කරුණක් පිළිබඳව හෝ හිතාමතා වසන් කිරීම නිසා එවැනිම දඬුවමක් මට එල්ලවන බවත් මා වටහා ගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–456—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ පෙරිය කල්ලාරු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ හා මංමුණේ දකුණ—එරුවිල් පෝරතිව් පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

පෙරිය කල්ලාරු උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මේ වයස් සීමාව බල නොපාන්නේ ය.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අතිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියලු විස්තර මෙම කායාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කායාලය, ග්‍රාම සේවක කායාලය, පළාත් පාලන ආයතන කායාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොළවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත්ව ඇත.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කායාලයෙන් ලබාගතහැකි ආකෘති පත්වල සකස් විය යුතු අතර ඒවා 1969 ජූනි මස 30 වැනි දිනට හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඩී. තෝසයියා,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1969 ජූනි 1,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායාලය.

6–332—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ I වැනි පංතියේ (MECHANIC/MACHINIST) යාන්ත්‍රික ශිල්පි හා යන්ත්‍ර ශිල්පි තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ I වැනි පංතියේ යාන්ත්‍රික/යන්ත්‍ර ශිල්පි තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් කෙළින්ම පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ, පරිපාලන නිලධාරි (ඉංජිනේරු) ආයතන වෙත 1969 ජූලි 14 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් පහතින් දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතුය. අයදුම්පතින් ඉල්ලා සිටින තනතුර ලියුම් කවරයේ දකුණු පස මුදුන් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

2. තනතුරු දෙවර්ගයම සඳහා බලපාන සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි :

(i) තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 1,170—42 × 12—රු. 1,674.

3. වයස් සීමාව.—අයදුම්කරුවන් අවම වශයෙන් අවුරුදු 25 ක් විය යුතු අතර අවුරුදු 35 ට වැඩි නොවිය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් කෙරෙහි උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

4. තනතුරු දෙවර්ගයට අදාළ සුදුසුකම් :

(i) පිළිගනු ලැබූ ආයතනයක I වැනි පංතියේ වෘත්තියකරුවන් වශයෙන් අවුරුදු 6 ට නොඅඩු පළපුරුද්දක් සහ එම වෘත්තියෙහිම මුළුමනින් අවුරුදු 10 ට නොඅඩු සේවයක් අයදුම්කරුවන්ට තිබිය යුතුය. ඒ බැව් සහතික මගින් සනාථ කළ යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයකින් සහ යහපත් ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(iii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි කියවීමට හා ලිවීමට හැකි විය යුතුය.

5. I වැනි පංතියේ යාන්ත්‍රික ශිල්පි සඳහා විශේෂ සුදුසුකම් :

(i) I වැනි පංතියේ යාන්ත්‍රිකයකු හට මයික්‍රො මීටරයක් කියවා දශමවලින් සටහන් කිරීමේ හැකිකමක් තිබිය යුතුය.

(ii) තමාට පවරනු ලබන යන්ත්‍රය හෝ ඉංජිනේරු ඒකකය හෝ පිළිබඳ මූලික ප්‍රතිපත්ති සහ තත් යන්ත්‍ර ක්‍රියා කරවීමද සම්බන්ධ සෑහෙන දැනුමක් තිබිය යුතු අතර එවැනි ඒකකවල ඇතිවිය හැකි දෝෂයක් අනාවරණය කොට පිළියම් යෙදීමටද හැකිවිය යුතුය.

(iii) එවැනි වැඩකටයුතුවලට අදාළ සැලසුම කියවා වටහා ගැනීමට හැකිවිය යුතුය.

(iv) තමාට පවරනු ලබන යන්ත්‍රාගාර හෝ යන්ත්‍ර වර්ගය අළුත්වැඩියා කරන අයුරු පිළිබඳ දැනුමක් තිබිය යුතුය.

සැළකිය යුතුයි.—වායු සමීකරණය, ශීතනය/අයිස් යන්ත්‍රාගාරය සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැණුමක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

6. I වැනි පංතියේ යන්ත්‍ර ශිල්පීන් (ලෝහ කර්මාන්තය) සඳහා විශේෂ සුදුසුකම් :

(i) ලෝහ කර්මාන්තය පිළිබඳ II වැනි පංතියේ යන්ත්‍ර ශිල්පියෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක හෝ පළපුරුද්දක් තිබිය යුතුය.

(ii) වැඩ සූදානම් කිරීමේදී අංක මුණන ආමානය ආදිය පාවිච්චි කිරීමට හැකි විය යුතුය.

(iii) අවශ්‍ය අවස්ථාවලදී ස්වකීය ආවුද මුවාත් තබා සූදානම්කර ගැනීමට හැකිවිය යුතුය.

(iv) ආවුදවල කෝණයන් හා මුදුන් කෝණයන් කැපීම පිළිබඳ නියම දැණුමක් තිබිය යුතුය.

සැළකිය යුතුයි.—වක්කඳ මුවාත් කිරීම සහ ආවුද කාමර වැඩ පිළිබඳ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් හට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. පහත සඳහන් සියලුම ලියකියවිලිවල මුල් පිටපතක් වාචික පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු නමුත් අධ්‍යාපන හා කාර්මික සහතිකවල මෙන්ම පළපුරුද්ද සනාථ කිරීම සඳහා එවන සහතිකවලද පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැළකිය යුතුයි.—උපකෘත පාසැල්වල රීතිමාලා යටතේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද බවුතිස්ම සහතිකය පිළිගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය (සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත් වූ ඉහළම විභාගයද ඇතුළුව).

(ඇ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඈ) චරිත සහතික.

8. රජයේ සේවයේ නියුක්ත අයගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු මුදා හැරීමට හැකිද, නොහැකිද යන වග අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානීන් බිසින් සඳහන් කළ යුතුවේ.

ඇම්. ඇස්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1969 ජූනි 1 වැනි දා.

### I වැනි පංතියේ යාන්ත්‍රික ශිල්පි/යන්ත්‍ර ශිල්පි තනතුර සඳහා ආදර්ශ අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. පුරවැසි භාවය ලබා ඇත්තේ පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :————.

4. උපන් දිනය :————.

5. අයදුම්පත්‍ර එවා ඇත්තේ කවර තනතුරක් සඳහාද යන වග :————.

6. අධ්‍යාපන සුදුසුකම් (සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත් වූ ඉහළම ප්‍රමාණය සඳහන් කළ යුතුය) :————.

7. කාර්මික හෝ වෘත්තීය සුදුසුකම් :————.

8. යාන්ත්‍රික ශිල්පි/යන්ත්‍ර ශිල්පියකු වශයෙන් ලබා ඇති පළපුරුදුකම් :————.

9. වෙනත් කරුණු (ඒ ඒ තනතුර සම්බන්ධයෙන් ලබා ඇති විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර මෙහි සඳහන් කළ යුතුය :————.

ඉහතින් සඳහන් කර තිබෙන විස්තර මගේ දැනුමේ හැටියට සත්‍යවූත් නිවැරදිවූත් බවට මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–326—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර ඔිතර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උතුරු අලුත්කුරු කෝරළේ කොට්ඨාශයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය

නැගෙනහිර ඔිතර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගතහැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 ජූලි 5 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත තැපැලෙන් ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රිචර්ඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1969 ජූනි මස 1 වැනි දින,
කොළඹ, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

6–387—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### සුළු සේවක ශ්‍රේණිවල පුරප්පාඩු

ගුවන් විදුලි සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීමේ අග දක්වෙන ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1969 ජූනි මස 28 දිනට පෙර කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවර තනතුරු නාමය පැහැදිලිව ලිවිය යුතුයි :—

1. විදුලි වැද්දුම්කරු—I පංතිය (අනියම්)

දිනකට රු. 7.50 යි. (සියළු දීමනා සහිතව).

**සුදුසුකම් :**

1. වෘත්තියට අදාළ මනින උපකරණ පිළිබඳව හා බින්දු වරදු ආගණනය කිරීම ඇතුළු ඒවායේ භාවිතය පිළිබඳවද මනා දැනීමක් තිබිය යුතුයි.
2. කියවීමට හා ලිවීමට පිළිවන් විය යුතුයි.
3. චාලක, ට්‍රාන්ස්ෆෝමර් ස්විච් ගියරය ආදියෙහි ඉන්සියුලේෂන් පරීක්ෂණ කිරීමට පිළිවන් විය යුතුයි.
4. නා නා විධ චාලක වර්ග පිළිබඳව හා සියළු වර්ගවල ස්ටාටර් පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුයි.
5. දෝෂ හා ඒවාට හේතු සොයා ගැනීමට හා ඒවාට පිළියම් කිරීමට පිළිවන් විය යුතුයි.
6. ඉන්සියුලේටින් තෙල් වර්ග පෙරීමට හා ඒවා පරීක්ෂා කිරීමට පිළිවන් විය යුතුයි.
7. රිලේ, ස්වයංක්‍රිය වෝල්ටේජ් රෙගුලේටර පිළිබඳ දැනීම.
8. ඇඳීම් හා රූප සටහන් කියවා තේරුම් ගැනීමට පිළිවන් විය යුතුයි.
9. ප්‍රථමාධාර පිළිබඳ පාඨමාලාවක් අනුගමනය කර තිබිය යුතුයි. ප්‍රථමාධාර දීමෙහි ප්‍රවීණතාවක් තිබිය යුතුයි.
10. යටත් පිරිසෙයින් අවුරුදු 6 ක් වත් 1 පන්තියේ වෘත්තීය සේවකයකු වශයෙන් කරනලද (සහතික මගින් තහවුරු කෙරෙන) සේවයක් ඇතුළු අවුරුදු 10 ක වෘත්තීය සේවයක් තිබිය යුතුයි.

2. විදුලි වැඩකරු—I පන්තිය (අනියම්)

දිනකට රු. 6.00 යි. (සියළු දීමනා සහිතව).

**සුදුසුකම් :**

1. ප්‍රථමාධාර පිළිබඳ පාඨමාලාවක් අනුගමනය කර තිබිය යුතුයි. ප්‍රථමාධාර දීමෙහි ප්‍රවීණතාවක් තිබිය යුතුයි.
2. 1/64" පරිමාණයක් කියවීමට හා භාගවලින් දක්වෙන දිග පළල ආදිය සටහන් කිරීමට පිළිවන් විය යුතුයි.
3. දෝෂ හා ඒවාට හේතු සොයා ගැනීමට හා ඒවාට පිළියම් කිරීමට පිළිවන් විය යුතුයි.
4. රිලේ, ඒ.වී.ආර්. හා එබඳු උපකරණ පිළිබඳව දැනීමක් තිබිය යුතුවේ.
5. ඇඳීම් හා රූප සටහන් කියවා තේරුම් ගැනීමට පිළිවන් විය යුතුයි.
6. යටත් පිරිසෙයින් අවුරුදු 6ක්වත් I පන්තියේ වෘත්තීය සේවකයකු වශයෙන් කරන ලද (සහතික මගින් තහවුරු කෙරෙන) සේවයක් ඇතුළු අවුරුදු 10 ක වෘත්තීය සේවයක් තිබිය යුතුයි.

3. විදුලි වැඩකරු—II පංතිය (අනියම්)

දිනකට රු. 6.00 යි. (සියළු දීමනා සහිතව)

**සුදුසුකම් :**

1. 1/32" පරිමාණයක් කියවීමට හා භාගවලින් දක්වෙන දිග, පළල ආදිය සටහන් කිරීමට පිළිවන් විය යුතුයි.
2. මනින උපකරණ හා ඒවායේ භාවිතය පිළිබඳව දැනුමක් තිබිය යුතුයි.
3. කේබල්, කම්බි හා ඒවායේ ප්‍රමාණයන් පිළිබඳව දැනීමක් තිබිය යුතුයි.
4. නොයෙක් ආකාරයේ කම්බි පිරිද්දුම් හා වයර් කිරීම් පිළිබඳව දැනීමක් තිබිය යුතුයි.
5. චාලකවල හා කි.ව. 5 ප්‍රමාණ දක්වා කුඩා ට්‍රාන්ස්ෆෝමර්වල ඉන්සියුලේෂන් පරීක්ෂණ කිරීමට පිළිවන් විය යුතුයි.
6. පිළිගත් ආයතනයක එම ශ්‍රේණියෙහිම (සහතික මගින් තහවුරු කෙරෙන) අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුයි.

4. ඩීසල් ෆිටර්—I පංතිය (අනියම්)

දිනකට රු. 7.50 යි. (සියළු දීමනා සහිතව).

**සුදුසුකම් :**

1. ඩීසල් ඇන්ජින් සවිකිරීම පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුයි.
2. ඩීසල් ඇන්ජින් ක්‍රියාකිරීම පිළිබඳ මූල ධර්ම ගැන දැනුමක් තිබිය යුතුයි.
3. ඩීසල් ඇන්ජින් සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කිරීම සම්බන්ධව පළපුරුද්දක් තිබිය යුතුයි.
4. විදුලි කම්බි සවිකිරීම පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුයි.
5. ඩීසල් ඇන්ජින් පිළිබඳ ඇඳීම් හා රූප සටහන් කියවා තේරුම් ගැනීමට පිළිවන් විය යුතුයි.

5. උයන් ගොවි තනතුර

වැටුප් ක්‍රමය—රු. 155—230 (5 × 15)

වයස : අවුරුදු 22-35 දක්වා.

**සුදුසුකම් :**

1. VII ප්‍රමාණයෙන් සමත්ව සිටිය යුතුයි.
2. මිශ්‍ර පෝර සෑදීම (කොම්පෝස්ට්) අලංකාරය සඳහා වවන පැළෑටි කප්පාදු කිරීම, පැළෑටි පෝච්චිවල සිටුවීම හා අලංකාරය සඳහා වවන පැළෑටි වගී බෝකරන නානා විධි ක්‍රම ඇතුළුව ගෙවතු තබාගැනීම පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුයි.
3. අතින් ක්‍රියාකරන තණ කැපීමේ යන්ත්‍රයක් සිරුමාරු කර එයින් තණ පිටියක් කැපීමේ හැකියාව.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 මැයි මස 7 වැනි දින,
කොළඹ 7.

### ආදර්ශ අයදුම්පත

1. තනතුර :————.
2. නම හා ලිපිනය :————.
3. වයස (උපන් දිනයත් සමග), (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
4. අධ්‍යාපනික සුදුසුකම් :————.
5. චරිත සහතික දෙකක් ලබාගත් අයගේ නම් මෙහි සඳහන් කළ යුතුයි :————.
6. වෘත්තීය සුදුසුකම් හා ලබා ඇති පුහුණුව පිළිබඳ විස්තර (අධ්‍යාපනික/වෘත්තීය හා චරිත සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
7. කලින් සේවය පිළිබඳ විස්තර දින සහිතව :—

ආයතනය :————.

තනතුර :————.

සේවා කාලය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6-457—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## අධිකාරිවරයෙකු සඳහා පුරප්පාඩුව

ආණ්ඩුවේ මුද්‍රණාලයේ අධිකාරී තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම කාර්යාලයෙන් සපයනු ලබන ආකෘති පත්‍රවල සම්පාදිත ඉල්ලුම් පත්‍ර 1969 ජූලි 5 වැනි දින දවල් 12ට පෙර, කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ලැබෙන සේ එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය හෝ ඊට සම්බන්ධිත වෙන යම් ලියකියවිලි හෝ ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු අතර, දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුට පෞද්ගලිකව නො එවිය යුතු ය.

2. **වැටුප් පරිමාණය.**—වාර්ෂික වැටුප 4,080න් පටන් ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 12කින් වර්ෂයකට රු. 8,400 දක්වා වැඩි වනවා ඇත.

3. **වයස් සීමාව.**—අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. මෙම වයස් සීමාවන් දෙපාර්තමේන්තු අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

4. **අවශ්‍ය අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්.**—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇති විද්‍යා උපාධිධරයකු විය යුතු ය. භෞතික විද්‍යාව පිළිබඳ දැනීම අතිරේක සුදුසු කමක් වනු ඇත.

(ii) දෙපාර්තමේන්තු අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඔවුනට—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් හෝ සමත් සහතිකයක් සහ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණ වෘත්තියේ කිනම් කාර්මික අංශයෙක හෝ යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණ වෘත්තියෙහි කිනම් කාර්මික අංශයක හෝ යටත් පිරිසෙයින් අවුරුදු 15 ක පළපුරුද්දක් තිබීම.

(ඇ) ඉහත සඳහන් (අ) හෝ (ආ) අනුව ඉල්ලුම් පත් භාරගනු ලබනුයේ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණ වෘත්තියේ කාර්මික අංශවල තනතුරක් එවකට (ඉල්ලුම් පත් එවන අවධියේ) දරන නිලධාරීන්ගෙන් පමණකි.

(iii) ලන්ඩන් ස්කූල් ඔෆ් ප්‍රින්ටින් ඇන්ඩ් ග්‍රැෆික් ආර්ට්ස් හෝ මැන්චෙස්ටර් කොලේජ් ඔෆ් ටෙක්නොලොජි හෝ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ලන්ඩන් හෝ බ්‍රිටිෂ් ෆෙඩරේෂන් ඔෆ් මාස්ටර් ප්‍රින්ටර්ස් හෝ වැනි පිළිගත් විද්‍යාල හෝ මුද්‍රණ ආයතනවල හෝ ඩිප්ලෝමා සහතික ප්‍රදානයන් ආදිය තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

5. **බඳවාගන්නා ආකාරය.**—බඳවාගැනීම මේ සඳහා පිහිටුවනු ලබන මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙනි.

6. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

7. **සේවා කොන්දේසි.**—

(i) තෝරාගත් අයදුම්කරු ආණ්ඩුවේ මුද්‍රණාලය ඇතුළත ශාඛා කීපයකටම මාරු කරනු ලැබීමට හැකිවේ.

(ii) තෝරාගත් අයදුම්කරු තමා අයත් ශාඛාවේ අවශ්‍යතාවය අනුව දිවා කාලයෙහි හෝ රාත්‍රි කාලයෙහි හෝ වැඩ කිරීම අවශ්‍යවන අතර, ඔහු (සාර්ථක අයදුම්කරු) පාර්ලිමේන්තු ශාඛාවට (රාත්‍රි අධිකාරී වශයෙන්) පත් කරනු ලැබුව හොත් නිත්‍ය රාත්‍රී සේවයේ නියුක්ත විය යුතුවේ.

(iii) සාර්ථක වූ අයදුම්කරු පාර්ලිමේන්තු ශාඛාවට (රාත්‍රි වැඩ මුරයට) යොදවනු ලැබුව හොත් වැටුපෙන් (මූලික වැටුපෙන්) සියයට පහලොවක දීමනාවක් ගෙවනු ඇත.

(iv) පත්වීම අවුරුදු තුනක ප්‍රවාසන (සෝදිසි) කාලයක් යටතේ ය.

(v) ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි නියුක්ත නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහු පළමුකොට වැඩ බැලීමට පත් කරනු ඇත.

8. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළකෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට ඔබේ සැලකිල්ල යොමු කරවමි.

9. තෝරාපත්කර ගනු ලැබූ අයහට දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අනුමැතිය පිට මුද්‍රණ ශිල්පය, ලේඛන කලාව සහ මුද්‍රණ පරිපාලනය පිළිබඳව මෙරට හෝ පිටරට පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය වුවහොත් නියම කෙරෙනු ඇත. මේ සම්බන්ධව විධිවිධාන එවැනි පාඨමාලාවක් හැදෑරීමට කටයුතු පිළියෙල කළ විටෙකදී දැනුම් දෙනු ඇත.

10. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පසු දින 7ක් ඇතුළත ඉල්ලුම්පත්‍ර ලැබුන බවට හැඟවීමේ දැනුම්දීමක් නොලැබුන හොත් වහාම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ඒ බැව් දැන්විය යුතු ය. මෙකී ප්‍රකාර ක්‍රියා නොකළ හොත් සලකා බැලීම සඳහා තිබෙන අයිතිවාසිකම්වලට ඉල්ලුම් කරුවන් අහිමිවනු ඇත.

11. අයදුම්කරුවන් නියමිත ඉල්ලුම් පත්‍රයෙහි පුරවන ලද ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට ප්‍රථම මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවන් ප්‍රවේශමෙන් කියවා බලා තමා සර්වප්‍රකාරයෙන්ම ඊට සුදුසුදැයි ප්‍රත්‍යක්ෂ කරගත යුතු බවට අවවාද කරමි. අයදුම්කරුවන් මෙම දැන්වීමෙහි ඇති කරුණු යථා පරිදි අවබෝධ කර ප්‍රස්තුත තොරතුරු ආකෘති පත්‍රයෙහි සපයා ඇති බවට නිසැක විය යුතුය.

12. ලියවිලි කිසිවක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය. එසේ වුවද අවශ්‍යවූ විටෙක, අයදුම්කරුවන් පහත සඳහන් ලියකියවිලි වලින් කීපයක් හෝ සියල්ලම ඉදිරිපත් කළ යුතු වේ :—

(1) උප්පැන්න සහතිකය ,

(2) උපාධි හෝ වෙනත් අධ්‍යාපනික සහතික ;

(3) චරිත සහතික දෙකක්—ඉන් එකක් අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ (ප්‍රධානියා), විද්‍යාලයාධිපති, ප්‍රධානාචාර්ය හෝ මහාචාර්ය යන අයෙකුගෙන් ;

(4) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(5) සිංහල හා/හෝ දෙමළ පිළිබඳව ලබා ඇති උසස්ම සහතිකය.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 5 වැනි දින,
කොළඹ 8,
ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

6–362—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

අංකය විආ/3/113.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1969 එක්සත් අරාබි ජනරජය පිරිනමන ශිෂ්‍යත්ව

එක්සත් අරාබි ජනරජය විසින් පහත සඳහන් විෂයයන්හි පූර්ව උපාධි අධ්‍යයනය සඳහා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

ඉස්ලාම් ධර්මය

ඉංජිනේරු විද්‍යාව

කෘෂිකර්මය

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කැරේ.

**සංලක්ෂ්‍යය 1.**—පහත සඳහන් අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ :—

(අ) ස්ථිර තනතුරු දරන හා තනතුරුවලට ස්ථිර කරනු ලැබ සිටින රජයේ නිලධාරීන්.

(ආ) මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා එවැනි වෙනත් රජයේ ආධාර හා අනුග්‍රහ ලබන ආයතනවල සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන්.

(ඉ) දැනටමත් විශ්ව විද්‍යාලයක හෝ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ හෝ ලංකාවේ කාර්මික විද්‍යාල/ආයතනවල කිසියම් පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

**සංලක්ෂ්‍යය 2.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය :** ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අවුරුදු 4 සිට 6 දක්වා වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ එක්සත් අරාබි ජනරජ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1969. 9. 1 වැනි දිනට වයස අවුරුදු 18 හා 21 අතර විය යුතුය.

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී පහත සඳහන් කොට ඇති පරිදි විෂයයන් 3 ක් එකම වතාවකදී සමත් වී සිටිය යුතු අතර, යටත් පිරිසෙයින් එයින් එක් විෂයයකට වත් සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

(අ) ඉල්ලුම් කරන්නේ ඉස්ලාම් ධර්මය සඳහා නම් :—
ඉස්ලාම්
අරාබි භාෂාව
වෙනත් කිසියම් විෂයයක්.

(ආ) ඉල්ලුම් කරන්නේ ඉංජිනේරු විද්‍යාව සඳහා නම් :—
ශුද්ධ ගණිතය
ව්‍යවහාරික ගණිතය
භෞතික විද්‍යාව.

(ඇ) ඉල්ලුම් කරන්නේ කෘෂිකර්මය සඳහා නම් :—
උද්භිද විද්‍යාව
සත්ව විද්‍යාව
රසායන විද්‍යාව.

(iv) අරාබි භාෂාව ඉගෙනීමට කැමති විය යුතුය. ඉංජිනේරු විද්‍යා හා කෘෂිකරම ක්ෂෙත්‍රයයන් හි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය කොටසක් අරාබි භාෂාවද, කොටසක් ඉංග්‍රීසි භාෂාවද වන නිසා අරාබි භාෂා දැනුමක් නොමැති අය එක්සත් අරාබි ජනරජයේ විශේෂ භාෂා ආයතනයක එක් අවුරුදු පමණ කාලයක් අරාබි භාෂාව පිළිබඳ පාඨමාලාවක් අනුගමනය කිරීම අපේක්ෂා කැරේ. (ඉස්ලාම් ධර්මය සම්බන්ධයෙන් ඉගැන්වීමේ භාෂා මාධ්‍යය මුලුමනින්ම අරාබි භාෂාව වේ.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) එක්සත් අරාබි ජනරජයට යාම සහ ආපසු ඒම සඳහා ගමන් ගාස්තු.

(ආ) ඊජිප්තු පවුම් 12 ක දීමනාවක්. මේ දීමනාවෙන් ඊජිප්තු පවුම් 6 හා 7 අතර ගණනක් කෑම් බීම් හා ඉඳුම් හිටුම් සඳහා අඩුකරගනු ලැබේ.

(ඇ) නොමිලයේ ඉගැන්වීම.

(ඊජිප්තු පවුම් 1 ක් රුපියල් 17.0925 කට සමාන වේ.)

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් එක්සත් අරාබි ජනරජය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් එක්සත් අරාබි ජනරජයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබා දීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත් වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූරණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපෙක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූරණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම පත්, 1969. 6. 24 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන් සිය අයදුම්පත් තම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් එවිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1969 ජූනි මස 6 වැනි දින,
මැලේ වීදිය, කොළඹ 2,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

6–434—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### සැළසුම්කරු තනතුර

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ II වන පංතියේ සැළසුම්කරු තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර 1969 ජූනි මස 28 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප්, දීමනා හා සේවා කොන්දේසි.**—(i) මෙම තනතුර සඳහා නියමිත වැටුප් මය මෙසේය :—

රුපියල් 1,260න් පටන් ගෙන වර්ෂයකට රු. 120 බැගින් රු. 3,870 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් මේ තනතුර සඳහා ගෙවන අතර රු. 2,820 දී කාර්යක්ෂමතා කඩඉමක් ද වෙයි.

**සැ. යු.**—තෝරාගත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද ගැන සලකා බලා මූලික වැටුපට වැඩි වැටුපක් පටන් ගැනීමේදී භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව ගෙවිය හැක.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම් අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම—

(අ) වයසින් අවුරුදු 20ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි බවත්, මනා චරිතයකින් හා ශාරීරික සනීපයකින් යුක්ත බවත්,

(ආ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ සැළසුම්කරුවන් පිළිබඳ වූ අවුරුද්දක පූර්ණකාලීන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයෙකු බව හෝ ඒ සමාන තත්ත්වයේ වෙනත් අධ්‍යයන පාඨමාලාවක් (උදා. මිනින්දෝරු සැළසුම්කරුවන් පිළිබඳ අධ්‍යයන මාලාව) සමග අවුරුදු දෙකක ආධුනිකත්වයක්, හෝ

(ii) අවුරුද්දක ආධුනිකත්වයක් සහිතව ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකවරුන් පිළිබඳ අධ්‍යයන මාලාව හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් පිළිබඳ අධ්‍යයන මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බව, හෝ

(iii) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ වරලත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතෙහි අවුරුදු හතරක නිත්‍ය ආධුනිකයෙකු වශයෙන් සේවය කොට අවුරුදු තුනක කාලයක් ලංකා කාර්මික විද්‍යාලයේ විවිධ ශ්‍රේණියන්හි පස්වරු පංතිවලට පැමිණි අයෙකු (මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් රු. 1,620ක වාර්ෂික පටන් ගැනීමේ වැටුපට හිමිය) හෝ

(iv) 1947 ට පෙර ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ දෙවැනි පෙළ සමත්, රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක සැළසුම් කරුවකු වශයෙන් හෝ උපකරණ ද්‍රව්‍ය ඇස්තමේන්තු කරන්නෙකු වශයෙන් අවුරුදු දෙකකට වැඩි කාලයක් සේවය කළ අයෙකු, හෝ

(v) අවුරුදු 5 ක කාලයක් සැළසුම්කරුවකු වශයෙන් ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ වරලත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතෙහි සේවය කළ අයෙකු හෝ

බවත් ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපතක් (සැ. යු.—බෞතීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ii) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(iii) ළඟදී ලබාගත් චරිතය පිළිබඳ සහතික පත් 3 ක්.

මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුලින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම පිළිබඳ වූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ඩබ්ලිව්. පත්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්),
පළාත් පාලන අමාත්‍යාංශය.

ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
1969 මැයි මස 29 වැනි දින.

### පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිමර්ාණ අංශය II වන පංතියේ සැළසුම්කරුවන්ගේ තනතුරු පිළිබඳ වූ ආකෘතිපත්‍රය

1. **සම්පූර්ණ නම :**————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.

4. ජාතිය :————.

5. දැන රක්ෂාවක් කරයි නම් එය :————.

6. දැනට රක්ෂාවක් නොකරයි නම් අන්තිමවරට කළ රක්ෂාව :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.

8. කාර්මික සුදුසුකම් :————.
(සමර්ථ වූ විභාග සඳහන් කරන්න)

9. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.

10. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.

11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම් ඉන් අස්වීමට හේතුව :————.

12. වැටුප්, දීමනා හා සේවා කොන්දේසි.—
ඇත්නම් වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–435—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### පරීක්ෂක තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ පරීක්ෂක තනතුරු දෙකකක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් ඉල්ලුම් පත්‍ර 1969.6.28 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් දීමනා හා සේවා කොන්දේසි.**—

(i) මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේය :— රු. 3,900 න් පටන්ගෙන වර්ෂයකට රු. 180 බැගින් රු. 5,340 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් මේ තනතුර සඳහා ගෙවන අතර රු. 4,980 දී හා කාර්යක්ෂමතා කඩඉමක් ද වෙයි.

(ii) තෝරාගත් ඉල්ලුම්කරු කාර්යක්ෂමතා කඩඉමෙන් ඉහළට උසස් කරනු ලබන්නේ ඔහු කටුබැද්දේ ප්‍රායෝගික විද්‍යායතනයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ පාඨමාලාවේ I කොටස හා II කොටය සාර්ථක ලෙස සම්පූර්ණ කළහැකි වුවහොත් පමණි.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම— (

(අ) වයසින් අවුරුදු 25 ට නො අඩු අවුරුදු 45 ට නොවැඩි බවත් ;

(ආ) මනා චරිත ශුද්ධියකින් හා යහපත් ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත බවත්,

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වූ අයෙක් බවත්,

(ඇ) මැනීම හා මට්ටම් කිරීම පිළිබඳ සර්වේයර් ජනරාල්ගේ බලපත්‍රය ලබා ඇති අයෙකු බවත්,

(ඉ) මැනීම පිළිබඳව හෝ ගොඩනැගිලි තැනීම පිළිබඳව හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව හෝ, නගර නිර්මාණය පිළිබඳව හෝ අවුරුදු 8 ක පළපුරුද්දක් ඇත්තකු බවත්, ඔප්පු කිරීමට සුදුසු සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය.

සැ. යු.—ගොඩනැගිලි තැනීම පිළිබඳ දැනුමක් ඇති ඉල්ලුම්කරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බවුතීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ආ) ඉල්ලුම්කරු ලබා ඇති උසස් ම අධ්‍යාපන හා කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) මෙම තනතුර සඳහා ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිත ශුද්ධිය හා යෝග්‍යතාවය පිළිබඳව මෑතදී ලබාගත් සහතික 3 ක් (දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් මෙම උපඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

සැ. යු.—මෙම සහතික පත්‍රවල හා චරිත සහතික වල පිටපත් ඉල්ලුම්කරුවන් වෙත ආපසු එවනු නොලැබේ.

6. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කොට නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනයට කලින් ලැබී එහිදී ප්‍රමාද වී නම් ඊට හේතුව වශයෙන් පිළිගත හැකි කරුණු දක්වා එය භාර ගන්නා ලෙස එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළොත් මිස, භාරගනු නොලැබේ.

7. මෙම තනතුර සඳහා එවන ඉල්ලුම් පත්‍රද, ඒ සම්බන්ධව එවන ලියුම් ආදියද එවිය යුත්තේ පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුලින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරු වලට පත් කිරීම් පිළිබඳ වූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ඩබ්ලිව්. පද්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්),
පළාත් පාලන අමාත්‍යාංශය.

ඩී. ආර්. විජේවර්ධන මාවත,
1969.5.30.

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ පරීක්ෂකවරයෙකුගේ තනතුර පිළිබඳ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය :————.

4. ජාතිය :————.

5. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.

6. දැනට රක්ෂාවක් නොකරයි නම්, අන්තිම වරට කළ රක්ෂාව : ————.

7. ලැබුන වැටුප :————.

8. අධ්‍යාපන සුදුසුකම් :————.

(සමර්ථවූ විභාග සඳහන් කරන්න.)

9. කාර්මික සුදුසුකම් :————.

(සමර්ථවූ විභාග සඳහන් කරන්න.)

10. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.

11. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.

12. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම්, ඉන් අස්වීමට හේතුව :————.

13. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත්නම්, වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————,
අත්සන.

දිනය :————.

6–436—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### සිංහල හා දෙමළ මාධ්‍ය පාඨශාලාවල ඉංග්‍රීසි උප ගුරුවරුන් වශයෙන් සේවය කිරීම සඳහා ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය—1969

සාමාන්‍ය.—සිංහල හා දෙමළ මාධ්‍ය පාඨශාලාවල ඉංග්‍රීසි උප ගුරුවරුන් වශයෙන් සේවය කි මට ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගයක් 1969 සැප්තැම්බර් මස 9 වැනි දින විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ. මෙහි දැක්වෙන ව්‍යවස්ථා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුදැනීම ඇතිව පිළියෙල කරන ලදී.

2. සේවා තත්ත්වය.—ශිෂ්‍ය ගුරු පත්වීම් තාවකාලිකය. විශ්‍රාම වැටුප් එම තනතුරුවලට අයත් නැත. ඔවුන් පත් කරනු ලබන ඒ ඒ දිස්ත්‍රික්ක වලට ඔවුන්ගේ සේවය සීමාවේ. ඔව්හු අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක සේවයට අයත් වෙති.

3. බඳවා ගැනීමේ කොන්දේසි.—

(i) ශිෂ්‍ය ගුරුවරු පත්කරනු ලැබූ දිස්ත්‍රික්කයේ " දිස්ත්‍රික්ක ගුරු සේවයට " අයත්වේ. ඔහු/ඈ එම දිස්ත්‍රික්කය තුළ සේවය කළ යුතුය. අන්‍ය දිස්ත්‍රික්කයකට ස්ථාන මාරුවක් ඉල්ලීමට ඔහුට/ඇයට අවසර නැත.

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපදේශ සංග්‍රහයේ 128 වැනි ඡේදයෙහි සඳහන් නියෝගවලට ශිෂ්‍ය ගුරුවරයා අනුකූල විය යුතුය. එහෙත් 267 පාලන රෙගුලාසිය ශිෂ්‍ය ගුරුවරුනට අදාළ නොවේ.

4. සේවා කොන්දේසි.—

(අ) සේවය කරන පාඨශාලාවේ ප්‍රධානයාගේද, මාණ්ඩලික පරීක්ෂකගේද පරීක්ෂණයට ශිෂ්‍ය ගුරුවරයා ලක්වේ. ශිෂ්‍ය ගුරුවරයාගේ හැසිරීම හා සේවය පිළිබඳ වාර්තා වාරයෙන් වාරයට පළාතේ අධ්‍යාපන නිලධාරි වෙත ඔවුන් විසින් යවනු ඇත.

(ආ) අවුරුදු 4ක කාල සීමාවක් තුළ දී, ගුරු විභාගයකින් සමත් නොවන හෝ ගුරු විද්‍යාලයකට ඇතුළු නොවන හෝ ශිෂ්‍ය ගුරුවරුන්ගේ පත්වීම මුල් පත්වීමේ සිට අවුරුදු 4 ඉකුත් වූ පසු අහෝසි කරනු ලැබේ.

(ඉ) කවර අවස්ථාවකදී වුවත් වැඩ හා හැසිරීම සතුටුදයක නොවන ශිෂ්‍ය ගුරුවරයෙකු කලින් දැන්වීමක් නොමැතිව අස් කිරීමට ඉඩ තිබේ.

(ඊ) ජ්‍යෙෂ්ඨතාව හෝ විශ්‍රාම වැටුප් හෝ ගණන් ගැනීමේ දී, ශිෂ්‍ය ගුරු සේවය ඇතුළත් කරනු නොලැබේ.

5. දීමනා.—මසකට රු. 100ක් දීමනාවක් වශයෙන් ශිෂ්‍ය ගුරුවරයෙකුට ගෙවනු ලැබේ. මෙයට අමතරව කිසිම මුදලක් ශිෂ්‍ය ගුරුවරයෙකුට ගෙවනු නොලැබේ.

6. සුදුසුකම්.—

(අ) සෑම අයදුම්කරුවකුම ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) 1969 ජූලි මස 1 දිනට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 32 ට වැඩි නොවිය යුතුය.

(ඇ) (i) ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ විෂයයක් ඇතුළුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම.

හෝ

(ii) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයට පෙනී සිට ඉංග්‍රීසි භාෂාව විෂයයෙන් හා සිංහල/දෙමළ යන විෂයයෙන් සාමාර්ථ්‍යයක් ඇතිව විෂයයන් හයකින් සාමාර්ථ්‍යය ලබා තිබීම.

හෝ

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව (" ඒ " හෝ " බී ") නිර්දේශය සහ සිංහල/දෙමළ (" ඒ " හෝ " බී ") නිර්දේශය යන විෂයයන්ගෙන් සාමාර්ථ්‍යය ඇතිව විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථ ලබා තිබීම.

(උ) පහත 7 වැනි ඡේදයේ දී ඇති පරිදි අයදුම්කරු ඉල්ලුම් කරන ඡන්දදයක කොටස තුළ පදිංචිය පිළිබඳ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු ය.

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්. එහි පිට පැත්තේ පහත දැක්වෙන සහතිකය සැපයිය යුතු ය. එම සහතිකය කළ යුත්තේ අත්සන් පත්‍රය සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් ය :—

පිට පැත්තේ පෙනෙන ඡායාරූපය................................ගේ බවත්,
(අයදුම්කරුගේ සම්පූර්ණ නම)

පහත යොද ඇත්තේ ඔහුගේ/ඇගේ අත්සන බවත් මම සහතික කරමි.

.......................... ..............................
අයදුම්කරුගේ අත්සන. සහතික කරන්නාගේ අත්සන.

නම සහ තත්ත්වය :————.

දිනය :————.

ඉහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් නොකරන අයදුම් කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

17. ලියකියවිලි.—අයදුම් පත්‍රය සමග ලියකියවිලි කිසිවක් දෙපාර්ත මේන්තුවට නොඑවිය යුතුයි. සුදුසුකම් තහවුරු කිරීම පිණිස අවශ්‍යවන ලියකියවිලි එනම්, උප්පැන්න සහතිකය, විභාග පිළිබඳ මුල් සහතික හෝ ප්‍රතිඵල ලේඛන හෝ පාසල් ප්‍රධානයන්ගේ සහතික, පඩිංචිය ඔප්පු කිරීමේ ලියකියවිලි සහ රටේ සැළකිය යුතු දෙදෙනෙකුගෙන් මෑතදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක් ඉල්ලූ විටෙකදී ඉදිරිපත් කළ යුතු යි.

18. මෙම ව්‍යවස්ථාවල ඇතුළුව නැති කරුණක් පිළිබඳව අවසාන තීරණය විභාග කොමසාරිස් විසින් හා හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ තීරණය කරනු ලැබේ.

කේ. ඩී. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1969 ජූනි මස 1 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේදී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### සිංහල හා දෙමළ මාධ්‍ය පාඨශාලාවල ඉංග්‍රීසි උපගුරුවරුන් වශයෙන් සේවය කිරීම සඳහා ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය —1969

1. නම (මුලකුරු සමඟ) :————. | විභාග අංකය :————. (කාර්‍යාලයීය ප්‍රයෝජනය සඳහා)

2. සියළුම නම් සම්පූර්ණයෙන් :————.

3. ප්‍රවේශ පත්‍ර යනාදිය එවිය යුතු ලිපිනය :————.

4. ඉල්ලුම් කරන පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාශය :————.

5. එය අයිති දිස්ත්‍රික්කය :————.

6. පිරිමියෙක් නම් "පි" ද ගැහැණියක් නම් "ගැ" ද මෙහි සඳහන් කරන්න :————.

7. (i) මෙහි සඳහන් කරන ලද සියළුම තොරතුරු මා දන්නා පමණින් සත්‍ය බැව් ද,
(ii) මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකරන ලද වළංගු මුද්දර බැව් ද සහතික කරමි.
(iii) හැඳින්වීමේ පතක් මා නියමිත පරිදි ඉදිරිපත් නොකළොත් හෝ මා ඉල්ලන ඡන්දදායක කොටසෙහි පිහිටි දිස්ත්‍රික්කයට පිට දිස්ත්‍රික් කයක විභාගයට පෙනී සිටියොත් හෝ මගේ විභාගාපේක්ෂකත්වය අවළංගු විය හැකි බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

8. මුද්දර කොටුව :
සැළකිය යුතුයි.—මුද්දර මෙහි අලවා අයදුම්කරුගේ අත්සන හා දිනය යොද අවළංගු කළ යුතුය. මුද්දර එකපිට එක ඇලවිය යුතු නොවේ.

9. අයදුම්කරුගේ අනන්‍යතාව :————.
මෙම අයදුම්කරු මා හොඳාකාර අඳුනන බව ද අද දින මා ඉදිරියේ අත්සන් කළ බැව් ද සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ නම :————.
තත්ත්වය :————.

————,
සහතික කරන්නාගේ අත්සන.

ලිපිනය :————.

## විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එකී විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසි යට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයින් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂක යන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතු යි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහාකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිට වී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතින්ගේ විශෙෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

භාණ්ඩාගාර අංකය : 1/23/35/3 (ජී).

## දෛනික වේතන ලබන අනියම් යතුරු ලේඛකයන්ට හා ලඝු ලේඛකයන්ට තාවකාලික තත්ත්වය සහ මාසික වැටුප් පිරිනැමීමේ යෝග්‍යතා පරීක්ෂණය—1969 සැප්තැම්බර්

**1. පරීක්ෂණ දිනය :**

1966.3.23 දින අංක 685 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡෙදයේ සඳහන්, දෛනික වේතන ලබන අනියම් යතුරු ලේඛකයන්ට හා ලඝු ලේඛකයන්ට තාවකාලික තත්වය සහ මාසික වැටුප් පිරිනැමීමේ යෝග්‍යතා පරීක්ෂණය, විභාග කොමසාරිස් විසින් 1969 සැප්තැම්බර් මස 9 දින කොළඹ දී පවත්වනු ලැබේ.

**2. සුදුසුකම් :**

මේ දක්වා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු මගින් ස්ථිර දෛනික වේතන ප්‍රමාණයක් උඩ අනියම් පදනමක් මත සේවයේ යොදාගෙන ඇති යතුරු ලේඛකයෝ සහ ලඝු ලේඛකයෝ පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලත්තෝ නම් මෙම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුස්සෝ වෙති :—

1. ඔවුන් 1965.12.31 වැනි දින හෝ ඊට පෙර නියමිත අවසරය ලබා සේවයට බඳවා ගත් අය වීම ;
2. ඔවුනට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් අධ්‍යාපන සුදුසුකම් තිබීම ; (පහත සටහන් බලන්න.)
3. ඔවුන්ගේ වැඩ සහ හැසිරීම නොඅඩවාම සතුටුදායක ලෙස තිබීම ;
4. ඔවුන් මෙතෙක් සේවයේ යෙදී සිටීම.

**සටහන :**

(i) අධ්‍යාපන සුදුසුකම්, අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) වන අවස්ථාවක සේවකයෙකු විසින් (1) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ (2) අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ වාණිජ අංක ගණිතයත් ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. එතෙකුදු වුවත් යටත් පිරිසෙයින් ඉන් විෂයයන් පහකින් වත් එකම විභාග අවස්ථාවක දී සාමාර්ථය ලබා තිබිය යුතුය.

(ii) 1956.11.21 දින අංකය 331 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 (v) සහ (6) වැනි ඡේද අනුව සුදුසුකම් වශයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතිකය ඇතිව සේවයට බඳවාගෙන ඇති අනියම් ලඝු ලේඛකයන් ද මෙම යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

**3. අයදුම්පත් :**

**මෙම නිවේදනයේ අග පළ කර ඇති ආදර්ශ අයදුම් පත්‍ර ආකෘතියේ ප්‍රකාර ෆුල්ස්කැප් බාග කඩදාසිවල තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර අපේක්ෂකයන් විසින් සකස් කර ගත යුතුයි. මේ සඳහා එක් කඩදාසියක් පමණක් පාවිච්චි කළ යුතුයි. ආදර්ශ අයදුම් පත්‍රය ටයිප් ගසා පිළියෙල කර ගත හැක. නමුත් එය සම්පූර්ණ කළ යුත්තේ තමාගේම අත් අකුරිනි.**

තමා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් **1969 ජූලි 5 වැනි දින හෝ එයට පෙර විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි අයදුම්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.** දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් අයදුම්පත්, විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමේ දී නිලධාරියාගේ /නිලධාරිනියගේ වැඩ සහ හැසිරීම පිළිබඳ වාර්තා කොට, ඔහු/ඇය පරීක්ෂණයට පෙනී සිටීමට **සුදුසු බව සහතික කළ යුතුය. විභාග කොමසාරිස් විසින් භාර ගත් අයදුම් පත් ඇති නිලධාරීන්ට පරීක්ෂණයට පෙනී සිටීමට** රාජකාරි සඳහා මෙන් නිවාඩු දිය යුතු ය. **මේ සඳහා** ගමන් වියදම් ගෙවනු නොලැබේ.

**4. පරීක්ෂණ පරිපාටිය පහත දැක්වේ :**

**1. අනියම් යතුරු ලේඛකයෝ.**

**සිංහල/දෙමළ මාධ්‍යය**

විනාඩියකට වචන 20 ගණනේ වන අඩුම **වේගයකින්** විනාඩි 20ක් ඇතුළත පාඨයක් ටයිප් ගැසීම.

**ඉංග්‍රීසි මාධ්‍යය**

විනාඩියකට වචන 30 ගණනේ වන අඩුම වේගයකින් විනාඩි 20ක් ඇතුළත පාඨයක් ටයිප් ගැසීම.

**2. අනියම් ලඝු ලේඛකයෝ**

**සිංහල/දෙමළ මාධ්‍යය**

(i) විනාඩියකට වචන 50 ගණනේ විනාඩි 5ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝුගනින් ලියාගෙන එය විනාඩියකට වචන 5 ගණනේ සාමාන්‍ය විධියට ලිවීම ;

(ii) විනාඩියකට වචන 15 ගණනේ වන අඩුම වේගයකින් විනාඩි 20ක් ඇතුළත පාඨයක් ටයිප් ගැසීම.

**ඉංග්‍රීසි මාධ්‍යය**

(i) විනාඩියකට වචන 80 ගණනේ විනාඩි 5ක් කියවනු ලබන පාඨයක් ලඝුගණින් ලියාගෙන එය විනාඩියකට වචන 7 ගණනේ සාමාන්‍ය විධියට ලිවීම ;

(ii) විනාඩියකට වචන 30 ගණනේ වන අඩුම වේගයකින් විනාඩි 20ක් ඇතුළත පාඨයක් ටයිප් ගැසීම.

5. විභාග පැවැත්වීම සඳහා විභාග කොමසාරිස් විසින් පනවා ඇති නීතිරීතිවලට අපේක්ෂකයන් යටත් වන අතර, එම නීති රීති උල්ලංඝනය කළහොත් ඔහු විසින් පමුණුවනු ලබන කවර දඬුවමක් වුවද විඳින්නට සිදුවෙනවා ඇත. මෙම නීති රීති මෙම නිවේදනයේ අවසානයෙහි වෙන් වශයෙන් පළකොට ඇත.

6. පරීක්ෂණයේ දී පාවිච්චි කිරීම සඳහා අපේක්ෂකයන් විසින් තමාගේම යතුරු ලියන යන්ත්‍ර ගෙන ආ යුතුය. යතුරු ලියන යන්ත්‍ර සුරක්ෂිතව හා නොපමාව ආපසු භාර දෙන බව හැඟේ නම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ අභිමතය පරිදි තම දෙපාර්තමේන්තුවෙන් මෙම පරීක්ෂණය සඳහා පෙනී සිටින අපේක්ෂකයින්ට ඔවුන්ගේ කාර්යාලයීය යතුරු ලියන යන්ත්‍ර, ඔවුන්ගේ විභාග ශාලාව වෙත නොයාමට අවසර දිය හැකිය. එහෙත් මෙම අනුග්‍රහය දීමට පෙර එම අනුග්‍රහය ලැබීමට බලාපොරොත්තු වන සෑම නිලධාරියෙකුගෙන්ම යතුරු ලියන යන්ත්‍ර සුරක්ෂිතව හා නොපමාව ආපසු භාර දෙන බවටත් ඒවා පරිහරණය කිරීමේ දී සිදුවන අලාභහානි ආදියක් වෙතොත් ඒවාට වගකියන බවටත් ලිඛිත ප්‍රකාශයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ලබා ගත යුතුය.

**සැලකිය යුතුයි :**

විභාග කොමසාරිස් විසින් විභාග මධ්‍යස්ථානයේ දී අපේක්ෂකයන්ට යතුරු ලියන යන්ත්‍ර සපයනු **නො ලැබේ.**

7. මෙම පරීක්ෂණයෙන් සමත්වන අපේක්ෂකයන්ගේ නම් යථා කාලයේ දී ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ. තාවකාලික තත්ත්වය හා මාසික වැටුප් ප්‍රදානය සඳහා මෙසේ තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට ඔවුන් පත් කරනු ලබන ඕනෑම දෙපාර්තමේන්තුවක හෝ ස්ථානයක සේවය කිරීමට සිදුවනවා ඇත.

8. ලැබී ඇති ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් විසින් කාල සටහනෙහි පිටපතකුත් සමග ප්‍රවේශපත්‍ර නිකුත් කරනවා ඇත. පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශපත්‍ර පරීක්ෂණ මධ්‍යස්ථානය භාර පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතු ය.

එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

9. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද මීට අදාළ වූ වෙනත් යම් කරුණක් වේ නම් එය භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්ගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

ප. ධ. උඩුවෙල,
**භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.**

**1969 ජූනි මස 3 වැනි දින,**
**කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.**

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**දෛනික වේතන ලබන අනියම් යතුරු ලේඛකයන්ට හා ලඝු ලේඛකයන්ට තාවකාලික තත්වය සහ මාසික වැටුප් පිරිනැමීමේ යෝග්‍යතා පරීක්ෂණය—1969 සැප්තැම්බර්**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින් ලියන්න) :————.
2. තනතුර :————.
3 දෙපාර්තමේන්තුව :————.
4. කාර්යාලයීය ලිපිනය :————.
5. අනියම් ලඝුලේඛක/යතුරු ලේඛක තනතුරට පත් වූ දිනය : ————.
6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
   (අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය නම්, එක් එක් අවස්ථාවේ දී සමත් වූ විෂයයන් සඳහන් කරන්න.)
7. අනියම් ලඝු ලේඛක/යතුරු ලේඛක තනතුරට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය :————.
   (එනම් : සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි)

ඉහතින් මා දී ඇති තොරතුරු, මගේ සම්පූර්ණ විශ්වාසයේ සහ දැනුමේ හැටියට සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව දිවුරා සහතික කරමි. මේ විභාගය හා සම්බන්ධ නීතිරීතිවලට යටත්වීමට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.
(දෙපාර්තමේන්තු ප්‍රධානයා ඉදිරිපිට අත්සන් කළ යුතුයි.)

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතු යි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. අනන්‍යතා ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතු ය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාව විභාගශාලාධිපතීන්ට දැන්විය යුතු ය. විභාග ශාලවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමා විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතු ය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නො දිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතු ය.

කේ. ඊ. ඩබ්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

6–367—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා සිංහල ප්‍රවීණතා පරීක්ෂණ**

**අගෝස්තු/සැප්තැම්බර් 1969**

පූර්වෝක්ත පරීක්ෂණ 1969 අගෝස්තු 26 සහ සැප්තැම්බර් 2 වැනි දිනයන්හි පැවැත් වේ. මෙම පරීක්ෂණවලට පෙනී සිටින නිලධාරීන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ශාඛා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් 1969 ජූලි මස 12 වැනි දිනට ප්‍රථම මා වෙත එවිය යුතුයි.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1969 ජූනි මස 4 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදීය.

6–342—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට "ගිනියම්කර පෑස්සීමේ යන්ත්‍ර" (Welding Plants) සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින්ගෙන් සහ සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර, දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ 10); 1969 ජූලි මස 12 වෙනි සෙනසුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට සහ හරියාකාර ඉටුකිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුයි.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේ හෝ කාළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969.7.11 වෙනි සිකුරාදා දහවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1969 ජූලි 12 වෙනි සෙනසුරාදා පෙරවරු 11.05ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1969 ජූනි 5 වෙනි දින,
කොළඹ දී ය.

6-461—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කළුතර

1969 ජූනි මස 27 වැනිදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත දහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කළුතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| ස්ථානයේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. කළුතර අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ... | ගබඩා කාමර දියුණු කිරීම. |

සංලක්ෂ්‍යය : ක—කළුතර දිස්ත්‍රික්කය

2. කළුතරින් කළුතර අධ්‍යාපන කාර්යාලයේ හෝ බැහැර නෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර ම කුවිතාන්සිය කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රුපියල් 10,000 කට හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූනි මස 26 වැනිදා ප. ව. 3.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම්, ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන, හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළුම විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් කළුතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව කළුතර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 ජූනි මස 27 වැනිදා පෙ. ව. 10.30 ට කළුතර අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

කේ. බී. ආරියදාස,
කළුතර ප්‍රදේශයේ
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූනි මස 4 වන දින,
කළුතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

6-374—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් මස 11 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට ස්වයං ධාවන මඩහාරන යාත්‍රාවක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 11 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 ක මුදලක්, ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් හා රු. 25 ක මුදලක් ලියකියවිලි ගාස්තු වශයෙන් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ. ලියකියවිලි ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1969 සැප්තැම්බර් මස 9 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1969. 6. 13.
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

6-376—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

රෙදිපිළි සායම් සහ රසායන ද්‍රව්‍ය යනාදිය සැපයීම සඳහා ඒවා නිපදවන්නන්ගෙන් හා ඔවුන් ගෙන් නියෝජිතයින් ගෙන්, කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ, ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් 14 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සඳහා ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක.

1969 ජූනි 4 වැනි දින,
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රය.
යොමුව : සීඑ/ඩී/බී/53

6–371—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ත්‍රිකුණාමලය උප කොට්ඨාශය

ත්‍රිකුණාමලය උප කොට්ඨාශය යටතේ චිරුප්පිට්ටිකුලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩර් පත් ත්‍රිකුණාමලයේ ඕර්සිල් කන්දෙහි ත්‍රිකුණාමලය කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ජූලි 1 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවෙලේම සිදු කෙරේ.

ඒ ඒ වැඩය සඳහා දී ඇති මිළ ගණන් වූ රු. 29,000 හෝ ඊට වැඩි මුදල්වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා සමුපකාර සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

1969 ජූනි මස 27 වැනි දින දක්වා කාර්යාල වේලාවන්හිදී ත්‍රිකුණාමලය ඇල්ලේ හා කන්තලේ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාල වලින් ලබාගත හැකිය. ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත් සඳහා ඉල්ලුම්කරන විට ටෙන්ඩර්කරුවන් විසින් තමාගේ ලියාපදිංචි පොත දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරන වැඩ හා ඒවයේ වටිනාකමද දක්වෙන ප්‍රකාශනයක් ටෙන්ඩරය ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් ලබා ගැනීමට ඒ ඒ වැඩය සඳහා දී ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් වන රු. 50ක වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර ත්‍රිකුණාමලයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය.

ජී. බී. පෝල්,
වාරිමාර්ග ඉංජිනේරු,
ත්‍රිකුණාමලය උප කොටස.

ඇතුල්වරාය පාර,
ත්‍රිකුණාමලය, 2. 6. 69.

6–363—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යාපනය උප කොටස

කිලිනොච්චි උප කොටසට අයත් එලිපන්පාස් වම් ඉවුරේ ජලාශයේ බැම්මේ වාන ඉදිකිරීම සඳහා උතුරු කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන මගින් 8. 7. 69 අඟහරුවාදා පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 70,000 ටත් ඊට වැඩි ගණනකටත් ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් සහ විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

3. මේ වැඩ සඳහා ටෙන්ඩර් කිරීමට උවමනා හිස් පෝර්ම කාර්යාල වේලාවන් තුළ මෙහි පහත සඳහන් ඕනෑම කාර්යාලයකින් 4. 7. 69 පස්වරු 3 තෙක් ලබා ගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පැමිණෙන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි කරණ ලද පොත සහ දැනට මෙම දෙපාර්තමේන්තුවේ කරණ ලද වැඩ වල විස්තර ද ඉදිරිපත් කළ යුතුයි. එය ටෙන්ඩර් අනුමත කිරීමට එම තැනැත්තා සුදුසුද නුසුදුසුද යන්න දැන ගැනීමට වාරිමාර්ග ඉංජිනේරු මහතාට උපකාර වේ. මෙම හිස් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර මෙහි පහත සඳහන් ඕනෑම වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ රුපියල් 100 මුදලක් තැන්පත් මුදල් ගෙවා හෝ කච්චේරියක වුවත් ඉහත සඳහන් මුදල ගෙවා කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමද සෑහේ.

4. මෙම වැඩ සඳහා අවශ්‍ය වැඩි විස්තර කිලිනොච්චියේ පිහිටි යාපනය උප කොටස වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ කාර්යාල වේලාවන් තුල ලබා ගත හැකිවේ.

යාපනය, මන්නාරම, වවුනියාව, මුල්ලතිවු, වවුනිකුලම්.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
යාපනය උප කොටස.

කිලිනොච්චි, 2. 6. 69.

6–377—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ, අනුරාධපුර උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා අනුරාධපුර උතුරු මැද කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ජූලි 1 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

| වැඩයේ විස්තරය | | ලියා පදිංචි මුදල | | ටෙන්ඩර් අංකය |
| --- | --- | --- | --- | --- |
| | | රු. | | රු. |
| මහරත්මල්ගහවැව ප්‍රතිසංස්කරණය කිරීම | ... | 23,000 | ... | 25 |

2. වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණනට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1969 ජූනි මස 27 වෙනි දින දහවල 12 දක්වා කාර්යාලීය වේලාවන් තුලදී අනුරාධපුර/මහකනදරාව/රාජාංගනය/පදවිය යන වාරි මාර්ග කාර්යාල වලින් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්ම වල පමණක් ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතු ද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරි මාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා ඉහත සඳහන් ටෙන්ඩර් ඇප මුදල ඉහත සඳහන් කාර්යාල වල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය සඳහා සියළුම විස්තර සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුලදී අනුරාධපුර වාරි මාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. එස්. සබාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, අනුරාධපුර උප කොටස.

වාරි මාර්ග කාර්යාලය,
අනුරාධපුරය,
1969 ජූනි මස 3 වෙනි දින.

6–380—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගාල්ල උප කොටස

1969.5.9 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පලවූ දැන්වීම් සම්බන්ධවයි. ලංකා ඇල ප්‍රකෘතිමත් කිරීම සඳහා ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1969 ජූනි මස 27 වැනි දින පෙ. ව. 10 දක්වා දිගුකර ඇත. 1969.6.26 දින දවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා 1969.5.9 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය බලන්න.

ජේ. එම්. ඩී. එල්. සෙනවිරත්න,
වාරිමාර්ග ඉංජිනේරු, ගාල්ල උප කොටස.

වාරිමාර්ග කාර්‍යාලය,
ගාල්ල, 1969.6.1.

6–355—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අම්පාරේ 2ඊ වර්ගයේ නිවාසයක් තැනීම

1. ඉහත සඳහන් ගොඩනැගිල්ල අම්පාරේ තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.7.4 වෙනි දින පස්වරු 2.30 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරන ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබාගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රු. 25,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල විට 1969.6.27 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරන ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ 3, ගාලු පාරේ,
අංක 457 දරන ගොඩනැගිල්ලේ පීසිපී
සිවිල් ඉංජිනේරු කාර්යාලයේදීය.

6–471—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පී. වී. සී/පී. අයි. හෝ සී. අයි. පයිප්ප හා සවිකරණයන් සැපයීමට හා ගෙනවිත් භාරදීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පීවීසී/පී. අයි. හෝ සී. අයි. පයිප්ප හා සවිකරණයන් දෙපාර්තමේන්තුවේ, නාරාහේන්පිට සැල්වීනියා වැඩ පලට හා යන්ත්‍රාගාරයට සැපයීමට හා ගෙනවිත් භාරදීම සඳහා 1969.7.4 වැනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | විස්තර | ප්‍රමාණය | ගෙනවිත් භාර දිය යුතු දින |
|---|---|---|---|
| ඇල්. කිව්. 06. 03. 03 ... | අඩි 320 ක වතුර පීඩනයට ඔරොත්තු දෙන 6″ පයිප්ප ... දික් අඩි | 10,000 | ... 69. 8.30 |
| ඇල්. කිව්. 06. 03. 2 ... | අඩි 75 ක වතුර පීඩනයට ඔරොත්තු දෙන 6″ පයිප්ප ... දික් අඩි | 5,000 | ... එම |
| ඇල්. කිව්. 06. 03. 3 ... | අඩි 200 ක වතුර පීඩනයට ඔරොත්තු දෙන 4″ පයිප්ප ... දික් අඩි | 10,000 | ... එම |
| ඇල්. කිව්. 06. 03. 4 ... | අඩි 175 ක වතුර පීඩනයට ඔරොත්තු දෙන 3″ පයිප්ප ... දික් අඩි | 10,000 | ... එම |
| ඇල්. කිව්. 06. 03. 5 ... | අඩි 175 ක වතුර පීඩනයට ඔරොත්තු දෙන 2″ පයිප්ප ... දික් අඩි | 10,000 | ... එම |
| ඇල්. කිව්. 06. 03. 6 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 90 කැට් ... ... | 25 යි. | ... එම |
| ඇල්. කිව් 06. 03. 7 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 45 කැට් ... ... | 10 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 8 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 22½ කැට් ... ... | 15 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 9 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 90 කැට් ... ... | 5 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 10 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 45 කැට් ... ... | 15 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 11 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 22½ කැට් ... ... | 15 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 12 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 90 කැට් ... ... | 5 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03.13 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 45 කැට් ... ... | 10 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 14 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 22½ කැට් ... ... | 15 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 15 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 90 කැට් ... ... | 5 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 16 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 45 කැට් ... ... | 15 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 17 ... | 6″ විෂ්කම්භය ඇති අංශක 22½ කැට් ... ... | 15 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 18 ... | 6″ විෂ්කම්භය ඇති අංශක " ටී" කැලි ... ... | 10 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 19 ... | 6″ විෂ්කම්භය ඇති අංශක " ටී " කැලි ... | 10 යි | ... එම |
| ඇල්. කිව්. 06. 03. 20 ... | 6″ විෂ්කම්භය ඇති අංශක " ටී " කැලි ... | 10 යි | ... එම |

1. පයිප්ප සොකට් සමඟ නොවේ නම් සොකට් ද ඇතුළුව පයිප්ප වලට මිළ සඳහන් කළ යුතුය. ටෙන්ඩර් කරුවන්ගේ ගාස්තු ප්‍රමාණයට මෙය ද ඇතුළත් විය යුතුය. පයිප්ප සහ පයිප්ප සවි කරණයන් අඩි 200 ක වතුර පීඩනයට ඔරොත්තු දිය යුතුය. සියළුම පයිප්ප සහ සවිකරණයන් බී. ඇස්. ඇස්. හෝ ඒ සමාන තත්ත්වයේ තිබිය යුතුය. ටෙන්ඩර් කරුවන් හට සම්පූර්ණ ටෙන්ඩරයට හෝ කොටසකට ටෙන්ඩර් කළ හැකිය.

2. සියළුම ටෙන්ඩර් ටෙන්ඩර් අවසන් කරන ලද දිනයේ සිට සති 4 ක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

3. කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිණුමට, පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ කොළඹ ලංකා බැංකුවේ යෝක් වීදියේ ශාඛාවෙහි දී හෝ ටෙන්ඩර් කරන මුළු මුදලින් සියයට 5 මුදලක් ඇප වශයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කළ යුතුය. මෙම ඇප මුදල ආපසු ගෙවන්නේ සතුටුදයක අන්දමින් ටෙන්ඩරය අවසන් කළ පසුය.

4. එසේ කිරීමට යම් ටෙන්ඩර් කරුවෙකුට නියම කළ දින සිට දින 10 ක් ඇතුලත දී එම මුදල තැන්පත් නොකළහොත් වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට ඔහුගේ නම ද ඇතුළත් කිරීමට සිදු වෙනවා ඇත.

5. 1969.7.4 වැනි දින ප. ව. 2.30 වන තුරු පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් භාර ගනු ලබන අතර, මුල් ටෙන්ඩරය සහ පිටපත ද වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ලියුම් කවර දෙකක බහා " පයිප්ප හා සවි කරණයන් සැපයීම සඳහා මුල් ටෙන්ඩරය " " පයිප්ප හා සවිකරණයන් සැපයීම සඳහා ටෙන්ඩරයේ අනුපිටපත " යනුවෙන් සඳහන් කර කවර දෙකම හොඳින් මුද්‍රා තබන ලද එක් ලියුම් කවරයක බහා " පයිප්ප සහ පයිප්ප සවිකරණයන් සැපයීම " සඳහා ටෙන්ඩර් යනුවෙන් ලියුම් කරවයේ වම් පැත්තේ උඩ කෙලවරේ සඳහන් කර එවිය යුතුය.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නොරුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

7. ටෙන්ඩර් සියල්ල, එකක් හෝ ඉන් කොටසක් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජූනි මස 2 වෙනි දින,
පේරාදෙනිය, ගන්නොරුවේ කෘෂිකර්ම ඉංජිනේරු අංශයේ දීය.

6–385—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1. දික්කාපිටිය ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි යටලේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
2. මල්පොත ගොවි කාරක සභා ප්‍රදේශයේ ගම්බැද්දේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
3. මොරහෙල ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි කරවිලලන්ද ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
4. සාලුගහකඳුර ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි නින්දගම ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
5. ලුනුගල්ල ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි කහටදන්ඩ අමුණ බැඳීම.
6. සොරගුණේ ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි මහවෙලගම මහඇල ප්‍රතිසංස්කරණය කිරීම.
7. කිරවනාගම ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි නාරන්ගස් තැන්න ඇල සංවර්ධනය කිරීම.
8. කොස්ලන්ද ගම්පහ ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි කැලිපනාව ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
9. හල්දුම්මුල්ල ගොවි කාරක සභා ප්‍රදේශයේ පිහිටි ගිනිගත්ගල මූකලන්පෝටාව ප්‍රතිසංස්කරණය කිරීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූනි මස 25 දින දවල් 12 දක්වා බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ, වම් කෙළවරේ " සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 ජූනි මස 30 දින දවල් 12 ට පෙර බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම් ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති " ටෙන්ඩර් පෙට්ටියට " දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නා වූ නිලධාරීතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ, බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂාකර බැලීමට බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. " ලාංකික " යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. " ගොවිජන සේවා සහකාර කොමසාරිස් " යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරී තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජූලි මස 2 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

නෙවිල් පියදිගම,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
බදුල්ල දිස්ත්‍රික්කය.

බදුල්ල දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 ජූනි මස 3 දින දීය.

6–389—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්‍යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ ඒ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969.6.27 වන දින දවල් 2 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම් වලින් මෙන්ම වචනවලින්ද දැන්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ සැමෙකක් ම, ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ '' ........... සුළු වාරි කර්මාන්ත කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1969.6.28 වන දින පෙ.ව. 10 ට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්‍යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට '' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර් කරු විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන්, ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත්වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වූවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමුත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක, කාර්‍යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකා වල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්‍යාලීය වේලාවන් තුලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969.6.28 වන දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරී තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම්, මුල් ටෙන්ඩර පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. එෆ්. බාලචන්ද්‍ර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්‍යාලය,
1969.6.1 දිනදීය.

### වැඩ ලැයිස්තුව

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පිංකුඹුරේ අමුණ | ... | අමුණ බැඳීම | ... | ද.දෙ.හ.ප. |
| 2. | මොරයාය අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 3. | වඩුවාවේ රාවනා වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 4. | අස්වැද්දුම අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 5. | පොල්අඹේ බැම්ම | ... | බැම්ම බැඳීම | ... | එම |
| 6. | බෝගහ ඇල අමුණ යනාදිය | ... | දියුණු කිරීම | ... | එම |
| 7. | අංකේවෙල ගම්සභා පාර | ... | ඉස්සීම | ... | එම |
| 8. | කන්දති කුඹුරේ අමුණ | ... | අමුණ බැඳීම | ... | වැ.වි.හ.ප. |
| 9. | හේවායවෙල අමුණ | ... | එම | ... | එම |
| 10. | ලිඳපිටියේ අමුණ | ... | එම | ... | එම |
| 11. | පල්ලන්කුඹුරේ අමුණ | ... | එම | ... | එම |
| 12. | දෙනිය අමුණ | ... | එම | ... | එම |
| 13. | කොටාදළුපොත අමුණ | ... | එම | ... | එම |
| 14. | සැවැන්දන කුඹුරේ වාන | ... | වාන බැඳීම | ... | එම |
| 15. | බෝගහපැලැස්ස වැව | ... | දියුණු කිරීම | ... | එම |
| 16. | ගමවෙල්යාය අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 17. | පිටකොටුවේ අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 18. | පහල වැව ... | ... | අමුණ බැඳීම | ... | හි.හ.ප. |
| 19. | අමුණෝවෙල අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 20. | රඹේගම වැව | ... | ප්‍රතිසංස්කරණය | ... | එම |
| 21. | කම්බුව අමුණ | ... | අමුණ බැඳීම | ... | එම |
| 22. | පහලකෝන් වැව | ... | ප්‍රතිසංස්කරණය | ... | එම |
| 23. | කනපද්දනේ වැව | ... | ප්‍රතිසංස්කරණය | ... | එම |

| | | | |
|---|---|---|---|
| 24. | උල්පත් අංගේ වැව ... | දියුණු කිරීම ... | හි.හ.ප. |
| 25. | මහවාන බැම්ම ... | බැම්ම බැඳීම ... | ක.හ.ප. |
| 26. | මාවෙල බැම්ම ... | බැම්ම බැඳීම ... | එම |
| 27. | හුන්ගාවෙල බැම්ම ... | බැම්ම බැඳීම ... | එම |
| 28. | ඉරබඩගම මැද ඇල ... | රෙගුලේටරයක් සෑදීම | එම |
| 29. | සිරිගල බැම්ම ... | බැම්ම බැඳීම ... | එම |
| 30. | දංඩගමුව වැව ... | සොරොව්ව බැඳීම ... | එම |
| 31. | කරුවලගහ වැව ... | කඩ බැඳීම ... | එම |
| 32. | ඇත්තොට වැව ... | වාන බැඳීම ... | එම |
| 33. | කඩවලේ වැව ... | කඩ බැඳීම ... | ව.හ.ප. |
| 34. | දිගන් වැව ... | දියුණු කිරීම ... | එම |
| 35. | ඉද්දමල්පිටිය වැව ... | දියුණු කිරීම ... | එම |
| 36. | අට්ටන් වැව ... | දියුණු කිරීම ... | එම |
| 37. | සියඹලාගස්වැව ... | ප්‍රතිසංස්කරණය ... | එම |
| 38. | ඉහලවැව ... ... | එම ... | එම |
| 39. | මොරගස් වැව ... | එම ... | එම |
| 40. | කොතලවැටිය වැව ... | එම ... | එම |
| 41. | විකාදෙනිගම වැව ... | එම ... | එම |
| 42. | බෝදියාගම වැව ... | කඩ බැඳීම ... | එම |
| 43. | කත්තරගම වැව ... | හොරොව්ව සෑදීම ... | එම |
| 44. | අංගමු වැව ... ... | හොරොව්ව සෑදීම ... | එම |
| 45. | මොරගස් වැව ... | එම ... | එම |
| 46. | බලල්ල මහ වැව ... | රළපනාව සෑදීම ... | ව.හ ප. |
| 47. | දිවුල්වැව මහ වැව ... | දියුණු කිරීම ... | දෙ.මැ.හ.ප. |
| 48. | බලදොර මහ වැව ... | දියුණු කිරීම ... | එම |
| 49. | ගලට බැඳි වැව ... | ප්‍රතිසංස්කරණය ... | එම |
| 50. | පොතුපිටිය වැව ... | ප්‍රතිසංස්කරණය ... | එම |
| 51. | වැලි අමුණේ බැම්ම ... | බැම්ම බැඳීම ... | එම |
| 52. | අමුණු තුඩුවේ අමුණ ... | එම ... | එම |
| 53. | තෝරේ අමුණ ... | එම ... | එම |
| 54. | හාතාකුඹුර අමුණ ... | එම ... | එම |
| 55. | දඹේ අමුණ ... | එම ... | එම |
| 56. | කුණුකැටේ බැම්ම ... | එම ... | එම |
| 57. | කුඩාකොටුව වැව ... | ප්‍රතිසංස්කරණය ... | එම |
| 58. | මඩාටුව වැව ... | දියුණු කිරීම ... | එම |
| 59. | ඇකව වැව ... ... | යතුරු උපකරණ සැපයීම | එම |
| 60. | ගොන්නව වැව ... | ප්‍රතිසංස්කරණය ... | එම |
| 61. | ගල්වැව ... ... | එම ... | එම |
| 62. | බතලහේන වැව ... | එම ... | එම |
| 63. | පහල වැව ... ... | එම ... | එම |
| 64. | පිට වැව ... ... | එම ... | එම |
| 65. | මයිලගහ අමුණ ... | අමුණ බැඳීම ... | එම |

6–354—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## මහනුවර දිස්ත්‍රික්කය

### සුළු කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

උඩ පළාත

1. අලුගොල්ල උඩහදෙනියේ අමුණ තැනීම.
2. මැදපිටිය අඹේකුඹුරේ වෙලේ අමුණ සහ ඇල වැඩිදියුණු කිරීම.
3. සාලි ඇල වෙල්යායට වතුර ගෙන යන ඇල සහ ආරක්ෂිත බැම්ම සෑදීම.
4. පල්ලේදෙල්තොට හිඹුටුවැල්හේනේ ඇල වැඩිදියුණු කිරීම.
5. උලපනේ ජම්බුගහමුල අමුණ ඇල සෑදීම.
6. ගිරාඋල්ල අලුපොත වත්තේ ඇල අලුත්වැඩියා කිරීම.
7. තැලිහුන්න මහකුඹුරයායේ අමුණ සහ ඇල අලුත්වැඩියා කිරීම.
8. හිඳගල පුවක්පිටිය කුඹුරේ ඇල වේල්ල තැනීම.
9. මල්ගම පතනේවල අමුණ ප්‍රතිසංස්කරණය.
10. පුස්සැල්ලාව එගොඩ කුඹුරේ ඇල අලුත්වැඩියා කිරීම.
11. නාරන්විට ගුරුන්නැහෙලාගේ ඇල වැඩිදියුණු කිරීම.

උඩබුලත්ගම

12. අඹගමුව දොරකුඹුර අමුණ වැඩිදියුණු කිරීම.
13. රඹුක්පිටිය වතුර වැටෙන ඇල්ලේ අමුණ සෑදීම.
14. මැඩිල්ල කොස්බේරිය අමුණ සෑදීම.

මහනුවර

15. මිගම්මන අමුණ ඇල ප්‍රතිසංස්කරණය.
16. හිප්පොල දරාඩෙකුඹුර අමුණ සෑදීම.

ගලගෙදර

17. මුරුද්දෙනිය කන්දාකොටුව අමුණ තැනීම.
18. කොලුගල ගබඩාගල වල්අරඹේ අමුණ තැනීම.
19. කොලුගල් ඔය අමුණ නඩත්තුව.
20. ගලබාව ටකරංවෙලේ අමුණ තැනීම.

හාරිස්පත්තුව

21. කොන්ඩදෙනියේ කුරහන්කොටුවේ ඇල දියුණු කිරීම.
22. බත්ඹිකුඹුරේ ඇල වේල්ල ප්‍රතිසංස්කරණය.
23. කහවත්ත ඇස්සැද්දුමයායට ජල පහසුකම්.

පාතදුම්බර

24. තෙල්දෙණිය හෙනගැහුවල නිකානේවැව ප්‍රතිසංස්කරණය.
25. උඩගම පල්ලේගම හපුගහ අංගේ අමුණ බැඳීම.

උඩදුම්බර

26. ඩී. 34 ඇලේ 2 වැනි අතුරු ඇලේ ජලය පිටවන ස්ථානයේ බැම්ම බැඳීම.
27. ඩී. 34 ඇලේ ආරක්ෂක බැමි බැඳීම.

යටිනුවර

28. බලන කුමාරගලවත්තේ අමුණු තැනීම.
29. උඩවෙල අටලාගේ අමුණ සහ ඇල සෑදීම.
30. මාමුඩාවෙල වැලිපැලේ අමුණ සෑදීම.
31. දෙහිඅංග අස්සැද්දුමේ සිට ගුරුඹය දක්වා අමුණ ඇල ප්‍රතිසංස්කරණය.
32. කොටලිගොඩ වැලිපැලේ ඇලේ හියුම්බට යෙදීම.
33. ගල්අංග ඇලේ හදිරංකුඹුර ඇල වේල්ල ප්‍රතිසංස්කරණය.
34. මාමුඩාවල වැලි කුඹුරේ ඇල හැරවීම.
35. පැලව පහළගම දුම්මලදෙනිය කුඹුරේ ඇල වේල්ල සෑදීම.

උඩුනුවර

36. පෙනියාගොඩ අඹතලඇල්ලේ අමුණ අළුත්වැඩියාවට.

මැදදුම්බර

37. උඩවෙල ඇල අළුත්වැඩියා කිරීම.
38. කනදෙකුඹුර කිරෝනාවේ ඇල ප්‍රතිසංස්කරණය.
39. පොද්දල්ගොඩ හක්කලා ඇල අළුත්වැඩියා කිරීම.
40. මොටාමුරේ මැද ඇල අමුණ අළුත්වැඩියා කිරීම.
41. අළුත්වෙල වහළ ඇල පෝටාවලට ලෑලි යෙදීම.
42. වෙලපහළ වැවල අමුණ සහ ඇල අළුත්වැඩියා කිරීම.
43. මැදමහනුවර මිරිස්හේන ඇල වැඩිදියුණුව.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූනි මස 27 දින දවල් 12 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉල්ලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "......................... සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 ජූනි මස 30 දින පෙරවරු 9.30ට පෙර මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළතදී එම ටෙන්ඩර්කරු විසින් මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5 ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. ..........................................දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් එකෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරන නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජූනි මස 30 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. පී. ඇම්. විජයදෝරු,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

මහනුවර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ
කාර්යාලය,
1969 මැයි මස 27 වන දින දීය.

6–373—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### කහටගස්දිගිලිය නි.මි.යෝ.ක්‍රා. ගබඩාව ඉදිකිරීම සඳහා ටෙන්ඩර්

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලියේ නි.මි.යෝ.ක්‍රා. ගබඩාවක් ඉදිකිරීම සඳහා 1969 ජූලි මස 4 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 250ක් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ සඳහා රජයේ බලයලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 ජූලි මස 3 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජුනි 13 වෙනි දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

6–462/1—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ නි.මි.යෝ.ක්‍රා. ගබඩා ඉදිකිරීම සඳහා ටෙන්ඩර්

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ නි.මි.යෝ.ක්‍රා. ගබඩා දෙකක් "එකක් ධාරිතාවය බු. 50,000 බැගින්" ඉදිකිරීම සඳහා 1969 ජූලි මස 4 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් දෙසිය පනහක් (රු. 250) තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් තිස්පන්දහක් (රු. 35,000ක්) හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලයලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 ජූලි මස 3 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජූනි 13 වෙනි දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42 දරණ ස්ථානයේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

6–462/2—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## ටෙන්ඩර් දැන්වීමයි

1. මෙහි පහත දක්වා ඇති රෙදි පිළි සිදුව අද බිහිරි වැඩ පොළෙන් මිළදී ගැනීම සඳහා කොළඹ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා අධ්‍යක්ෂ විසින් 1969.7.4 වන සිකුරාද පෙරවරු 9.30 ට වන තුරු ටෙන්ඩර භාරගනු ලබනවා ඇත.

2. ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රු. 50 ක් ගෙවා එසේ ගෙවූ බවට ලැබෙන කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ලියා ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් 1969.7.3 දින පස්වරු 3 දක්වා ලබාගත හැක. ටෙන්ඩර ඇප මුදල මෙම කාර්යාලයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කළ හැකිය.

3. ටෙන්ඩරපත්‍ර පිටපත් දෙක බැගින් යුක්තව සකස් කොට කවරවල බහා මුද්‍රා තබා එහි වම් පස ඉහළ කෙළවරෙහි "රෙදි පිළි මිළදී ගැනීම සඳහා වූ ටෙන්ඩරය" යනු වෙන් ලියා එවිය යුතුය.

4. ටෙන්ඩර පත්‍ර ලියා පදිංචි කල තැපෑලෙන් එවිය යුතුය ; නොඑසේ නම් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

5. ටෙන්ඩර කෙරෙන රෙදි පිළි වර්ග හා ඒ ඒ වර්ග සඳහා ඉදිරිපත් කෙරෙන මිළ ගණන් මෙන්ම ඒ ඒ වර්ගයෙන් ටෙන්ඩර කෙරෙන ප්‍රමාණයද ටෙන්ඩර පත්‍රයෙහි සඳහන් විය යුතුය.

6. ටෙන්ඩර භාරගැනීමේ අවසාන දිනයේ සිට සති 4ක් ගතවන තුරු ටෙන්ඩරකරුවන් ඉදිරිපත් කරන ගණන් නොවෙනස්ව තබා ගැනීම අපේක්ෂිතය.

7. (අ) ටෙන්ඩරය පිළිගත් බව දැන්වීමෙන් දින 7 ක් ඇතුළත එම සාර්ථක ටෙන්ඩරය හිමි ටෙන්ඩරකරු භාණ්ඩවල වටිනාකම මුදලින් ගෙවා භාණ්ඩ ගෙනයාමට ක්‍රියා කළ යුතුය.

(අ) එසේ කිරීම අතපසු කළහොත් ටෙන්ඩර ඇප මුදල රාජසන්තක කොට, ටෙන්ඩර්කරුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලබනවා ඇත.

8. අසාර්ථක වූ ටෙන්ඩර හිමි ටෙන්ඩර්කරුවන් ඉල්ලා සිටි විට ඔවුන් ගේ ටෙන්ඩර ඇප මුදල් ආපසු ගෙවනු ලබන්නේය. සාර්ථක වූ ටෙන්ඩර හිමි ටෙන්ඩර්කරුවන්ගේ ඇප මුදල්, මෙහි 7 වන ඡෙදයෙහි අඩංගු නියම යන් පිළිපැදීමට යටත්ව, ඔවුන් ඉල්ලා සිටිවිට ආපසු ගෙවනු ලබන්නේය.

9. ටෙන්ඩරපත්‍ර 1969.7.4 දින පෙරවරු 9.30 ට සමාජ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ තැනගේ කාර්යාල කාමරයේ දී විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර විවෘත කරන වේලා වෙහි ටෙන්ඩරකරුවන්ට එම ස්ථානයට පැමිණ සිටිය හැකිය.

10. උපලේඛනයේ සඳහන් වන රෙදි පිළි සිදුව අද-බිහිරන් සඳහා වූ රැකවරණ සහිත වැඩපලේ දී සාමාන්‍ය කාර්යාල වේලාව තුළදී පරීක්ෂා කොට බැලිය හැකිය.

11. මේ රෙදි පිළිවල සැම්පල කොළඹ 3, 28 වන පටුමගේ (මල් පාරෙන් ඔබබෙහි) පිහිටි දෙපාර්තමේන්තු වෙළඳහලේදී පරීක්ෂාකොට බැලිය හැකිය.

12. භාණ්ඩ වෙන වෙනම ගත්කළ ඒවායේ වටිනාකම පදනම් කොට ටෙන්ඩර තක්සේරු කරනු ලබනවා ඇත.

13. කිසියම් එක් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර සියල්ලම හෝ ප්‍රශ්න කිරීමකට යටත් නොවී ප්‍රතික්ෂේප කිරීමේ නැත්නම් කිසියම් එක් ටෙන්ඩර යක කිසියම් කොටසක් පිළිගැනීමේ අයිතිවාසිකම සමාජ සේවා අධ්‍යක්ෂ තුමා වෙත තබාගනී.

14. මේ සම්බන්ධව තවදුරටත් අවශ්‍ය වන කිසියම් විස්තර ඇත්නම් ඒවා සිදුව අද බිහිරන් සඳහා වූ රැකවරණ සහිත වැඩපළේ අධිකාරිගෙන් ලබාගත හැක.

### භාණ්ඩ වර්ග උපලේඛනය

| වර්ගයේ නම | දිග පළල ආදිය | පාවිච්චි කොට තිබෙන නූල් වර්ගය | තිබෙන ප්‍රමාණය |
|---|---|---|---|
| හනිකුම්බ් තුවා ... | 24″ × 45″ | 2/20 සුදු කරන ලද ... | 50,000 |
| ඉඳුල් කඩ ... | 18″ × 18″ | 2/20 සුදු කරන ලද ... | 78,000 |
| කොටු සහිත දූවිලි පිස්නා ... | 24″ × 24″ | 2/20 සුදු නොකරන ලද ... | 45,000 |
| පිඟන් පිස්නා ... | 24″ × 30″ | 2/20 සුදු නොකරන ලද ... | 12,000 |
| කොටු සහිත කුස්සි තුවා ... | 24″ × 32″ | 2/20 සුදු නොකරන ලද ... | 20,000 |
| ස්වොබ්ස් ... | 12″ × 12″ | ගොතන නූල් ... | 18,000 |

ආර්. ඇල්. තිරුවෙල්වම්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

2.6.69.

6–356—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

**නාරාහේන්පිට—කම්කරු දෙපාර්තමේන්තු ලේකම් කාර්යාලයයේ 2 වන සහ 10 වන මහල සඳහා වායු සමීකරණ යන්ත්‍ර සපයා ඉදිකිරීම**

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්යය කර බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1969 ක්වූ ජූලි මස 29 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ පාසන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5යේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබා ගත් ටෙන්ඩර් ෆෝර්ම වලයි. වර්ෂ 1969 ක්වූ ජූලි මස 26 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969 ක්වූ ජූලි මස 29 වන අඟහරුවාදා පූ. භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්වූ ජූනි මස 13 වෙනි දින දීය.

6–382—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

1969 ජූලි මස 1 වැනි දින සිට 1969 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාල සීමාව තුළ ත්‍රිකුණාමලයේ පිහිටි ත්‍රිවිධ හමුදාවට එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන සැපයීම සඳහා 1969 ජූනි මස 24 වැනි දින පෙරවරු 10 තෙක් කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීම පිණිස, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, නැවත ලබා ගත හැකි රු. 75 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1969 ජූනි මස 23 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කෙරේ.

2. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාපති.

6–390—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදව

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාල සීමාව තුළ පහත සඳහන් සැපයීම් සඳහා, කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, එක් එක් සැපයීම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ :—

| 1<br>සැපයීම | | 2<br>ටෙන්ඩර් විවෘත කරන දිනය | | 3<br>ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරන අවසාන දිනය |
|---|---|---|---|---|
| (1) ත්‍රිකුණාමලයේ පිහිටි ත්‍රිවිධ හමුදවට එළවළු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිෂ්පාදන සැපයීම | ... | 1969.7.9 | ... | 1969.7.8 |
| (2) ත්‍රිකුණාමලයේ පිහිටි ත්‍රිවිධ හමුදවට, පාන් සහ ස්වදේශීය උදෑසන ආහාර සැපයීම ... | ... | 1969.7.9 | ... | 1969.7.8 |

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි, රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත, ඉහත සඳහන් එක් එක් ටෙන්ඩරයක් සඳහා නැවත ලබා ගත හැකි රු. 75 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. ඉහත සඳහන් සැපයීම් ඉදිරියෙහි 3 වැනි තීරයෙහි දක්වා ඇති දිනයන්හි දහවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති නිකුත් කෙරේ.

3. වැඩි විස්තර, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුද මූලස්ථානයෙන් දැනගත හැකිය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්, ගුවන් හමුදපති.

6–353—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය

### ෂාෆ්ටිං හා අශ්ව බල 52 ඇන්ජිම ආදිය විකිණීම

තේ කර්මාන්ත ශාලාවලින් ගලවන ලද පහත සඳහන් දෑ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් පහත අත්සන් කර ඇති අය විසින් බාරගනු ලැබේ. නො. 100, කාසල් වීදිය, කොළඹ 8, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවේදී මෙම දෑ පරීක්ෂා කළ හැක.

| අංකය | | විස්තරය |
|---|---|---|
| 1 | | ලක්ෂපාන පොරස් වතුයායෙන් ගලවන ලද තෙල් ටැංකිය, වායු සමනය හා ලොකු රෝදයද සමග සම්පූර්ණ වූ එච් වර්ගයේ අශ්වබල 52 දරන (එක) රස්ටන් හෝන්ස්බයි එන්ජිම |
| 2 | | කප්ලින්ස්වලින් සම්පූර්ණවූ, 3″, 2½″ හා 2″ විෂ්කම්භය ඇති වානේ ලයින් ෂාෆ්ටිංස් |
| 3 | 2 ක් | ... පටියකින් වැඩ කරවන අඟල් 34 තේ රෝලර් |
| 4 | 1 ක් | ... පටියකින් වැඩ කරවන අඩි 3 ක් පළල රෝල් බ්රේකර් |
| 5 | 1 | ලොට් විවිධ විෂ්කම්භය ඇති තඹ නල |

2. ඉහත සඳහන් දෑ ගලවන අවස්ථාවේදී, එම දෑ ඉතා හොඳින් පාවිච්චි කළ හැකි තත්ත්වයක තිබූ අතරදී ඒවා කොළඹට ගෙන යන ලදී.

3. මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර බාර දීමට පෙර, මෙම බඩු, අයදුම්කරුවන් විසින් පරීක්ෂා කරන ලෙස ඉල්ලා සිටින අතර, ඒවායේ තත්ත්වය ගැන සෑහීමකට පත් විය යුතු වේ.

4. අලෙවි කිරීමෙන් පසු, ඉහත සඳහන් ඇවල කොටස් හෝ එහි තත්ත්වය සම්බන්ධව කිසිම පැමිණිල්ලක් බාර නොගන්නා අතර එවැනි පැමිණිලි හෝ අලාභ සඳහා සංස්ථාව කිසිම වගකීමකට බැඳී නැති බව ද ප්‍රකාශ කරමු.

5. ජයග්‍රාහක අයදුම්කරු විසින් ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය විසින් පාලනය වන ලංකා බැංකුවේ ගිණුමට මුදල් තැන්පත් කර, කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු අතර, එම බඩු, දීමට පොරොන්දු වූ දින සිට දින 15 ක් ඇතුළතදී ඉවත් කළ යුතුවේ. නැති නම්, එම බඩු නැවත අලෙවි කරන අතර, ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වේ.

6. ආපසු ගත හැකි රු. 250 ක තැන්පත් මුදලක් තැබීමෙන්, මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් පත් ලබාගත හැක. මෙම ටෙන්ඩර් පත්‍ර 1969.6.24 දින ප. ව. 3 දක්වා පමණක් නිකුත් කරනු ලැබේ.

7. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍රවල, ඉල්ලුම් පත එවිය යුතු අතර, ලියුම් කවරයේ වම් කෙළවරේ " ෂාෆ්ටිං හා ඇන්ජින් මිලට ගැනීම සඳහා ඉල්ලුම් පත් " යනුවෙන් සඳහන් කර 1969.6.25 දින පෙ. ව. 10 ට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන්ට සැලැස්විය යුතුය. එදිනම පෙරවරු 10.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ කැමති අයදුම්කරුවන්ට පැමිණ සිටිය හැක.

8. සියලුම ටෙන්ඩර් පත් හෝ එම කොටසක් හෝ බාරගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සභාපති තුමාට බලය ඇත.

සභාපති.

1969 ජූනි 6 වෙනිදා,
ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය,
නො. 106, හැව්ලොක් පාර,
කොළඹ 5.

6–458—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### මීගමුව බන්ධනාගාරයේ එකතුවී ඇති ගිස් ගෝනි, පරණ ප්‍රවෘත්ති පත්‍ර සහ හිස් තේ පෙට්ටි විකිණීම

පහත අත්සන් කරන මා විසින් පහත සඳහන් ද්‍රව්‍ය විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර, 1969 ජූනි 20 වන දින පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ :—

1. හිස් ගෝනි 197.
2. පරණ ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් 98.
3. හිස් තේ පෙට්ටි 15.

2. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා රු. 10 ක තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක හෝ මෙම කාර්යාලයේ තැන්පත් කොට එම රිසිට් පත ටෙන්ඩර්පතට ඇමිණිය යුතුය. ටෙන්ඩර්පත්‍ර සීල් තැබූ කවරයන්හි බහා ලියා පදිංචි තැපැලෙන් එවීම හෝ මීගමුව බන්ධනාගාර දොරටුවේ ඒ සඳහාම තබා ඇති පෙට්ටියට දැමීම හෝ කළ හැකිය.

3. 1969 ජූනි 20 වන දින පෙරවරු 10.35 ට මගේ කාර්යාලයේ දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර් කරුට හෝ ඔහුගේ නියෝජිතයකුට පෙනී සිටිය හැකිය. ටෙන්ඩර් කරුවන් විසින් ද්‍රව්‍ය සියල්ලක්ම වෙනුවෙන් ඒකාබද්ධ මිළක් ඉදිරිපත් කළ යුතුය. වැඩිම මිළට ද්‍රව්‍ය සියල්ලක්ම දෙනු ලැබේ. යම් ටෙන්ඩරයක් පිළිගත් බව ලිපියකින් දන්වා දින 5 ක් තුළදී මුදල් ගෙවා ඉවත්කර නොගතහොත් ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට එම ටෙන්ඩර්කරුගේ නම වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුළත් කරනු ලැබේ.

ඉහත සඳහන් ද්‍රව්‍ය මීගමුව බන්ධනාගාරයෙන් විමසීමෙන් පරීක්ෂා කල හැකිය.

ආර්. ජේ. එන්. ජෝඩන්,
සහකාර අධිකාරි,
බන්ධනාගාරය, මීගමුව.

1969. 5. 13.

6–351—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය

### පාවිච්චි කරන ලද බඩු විකිණීම

පහත සඳහන් පාවිච්චි කරන ලද බඩු බාහිරාදිය මිළදී ගෙන ඉවත්කර ගැනීම සඳහා, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් වර්ෂ 1969 ජූනි මස 20 වෙනි දින පෙරවරු 10 දක්වා සීල් තබා එවන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

1. කාර්, වෑන්, ලොරි, ට්‍රැක්ටර් සහ ට්රේලර්වල පාවිච්චි කරන ලද ටයර් 153ක්.
2. කාර්, වෑන්, ලොරි, ට්‍රැක්ටර් සහ ට්රේලර්වල පාවිච්චි කරන ලද ටියුබ් 105ක්
3. වෝල්ට් 6 සහ 12 පාවිච්චි කරන ලද බැටරි 9ක්.
4. පාවිච්චි කරන ලද " ජේ. ඒ. පී." අවුට්බෝඩ් මෝටර් යන්ත්‍ර (මෝටර් බෝට්ටුවක්) 1ක්.
5. පාවිච්චි කරන ලද විදුලි උපකරණ සහ කොටස්—මීටර්, තඹ කම්බි, පොලොව යට කේබල් ආදිය—තොග 1යි.
6. පාවිච්චි කරන ලද ආයුධ, වාහන අමතර කොටස්, විවිධ බඩු බාහිරාදිය, පරණ යකඩ ආදිය—තොග 1 යි.

මෙහි පහත සඳහන් නිලධාරිතැනගේ ලිපිනයට ඉල්ලුම් පත් එවීමෙන් වැඩි විස්තර ලබාගත හැක. ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් හා ටැන්ඩර් ෆෝර්ම ගාස්තුව වශයෙන් රු. 50ක් එවන ඉල්ලුම්කරුවනට 1969 ජූනි 13 වෙනි දින සිට 19 වෙනි දින පස්වරු 2 දක්වා ටැන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් ෆෝර්ම ගාස්තුව ආපසු නොගෙවනු ලැබේ.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ,
සාමාන්‍යාධිකාරී.

1969 ජූනි මස 3 වැනි දින,
අනුරාධපුරය,
1969.6.3.

6–452—69.6.13 දින අංක 14,658 දරන ගැසට් පත්‍රය

## ඉලුප්පෙයිකඩවෙයි ධීවර නිවාස 25 ක් සෑදීම

ධීවර නිවාස යෝජනා ක්‍රමයක් සඳහා ඉලුප්පෙයිකඩවෙයි නිවාස 25 ක් සෑදීම සම්බන්ධයෙන් මන්නාරම් දිස්ත්‍රික්කයේ දිසාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ. මෙයට අදාල පිඹුරු ආදිය මන්නාරම කච්චේරියේ ඉඩම් අංශයේදී පරීක්ෂා කළ හැක.

2. 1969 ජූනි මස 24 වැනි අඟහරුවාදා පස්වරු 3 දක්වා මන්නාරම දිසාපතිගෙන් ලබාගතහැකි මෙම ටෙන්ඩර් පෝර්ම පිට පත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ඕනෑම කච්චේරියක රුපියල් 50.00 ක තැන්පත් මුදලක් තබා ඒ සඳහා නිකුත් කරන ලද කුවිතාන්සිය ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පළමුව ඉදිරිපත් කළ යුතුය. ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති සඳහා ද තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය. ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට නොහැකි වූවන් හට තැන්පත් මුදල් ආපසු ගෙවනු ලබන්නේ ටෙන්ඩර් අවසාන කරන දිනයෙහි නියමිත වේලාවට පෙර ටෙන්ඩර් පෝර්ම ආපසු ලැබීමට සැලැසුවහොත් පමණි.

3. 1969.6.27 වැනි දින පෙරවරු 12 ට පෙර මන්නාරම දිසාපති වෙත ලිපි කවරයේ "ඉලුප්පෙයිකඩවෙහි ධීවර නිවාස යෝජනා ක්‍රමය සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවීම හෝ මන්නාරම කච්චේරියේ තබාඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට හෝ පුළුවන. නියමිත දිනයෙහි නියමිත වේලාවේදී සියළුම ටෙන්ඩර් කරුවන් හට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

4. 1969.6.27 වෙනි දින පෙරවරු 12.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේදී සියලුම ටෙන්ඩර් කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමූපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ උවමනා සිමෙන්ති මිලයට ගැනීම සඳහා අවසර පත්‍රයක් ලබාගැනීම පිණිස සතුටුදායක ටෙන්ඩර්කරුවන් වෙත රෙකමදාරුවක් නිකුත් කරනු ලැබේ. සිමෙන්ති දුර්ලභවීම හෝ සිමෙන්ති සැපයීම ප්‍රමාදවීම හෝ කොන්ත්‍රාත්තුවට අනුව වැඩ නිමකිරීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් සතුටුදායක හේතුවක් ලෙස සලකනු නොලැබේ.

6. සතුටුදායක ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩරයකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් සියයට 5 ක් සතුටුදායක ලෙස වැඩ නිමකිරීමේ ඇප මුදලක් වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදායක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදායක ටෙන්ඩර් කරුවන් හට මෙසේ දැනුම්දී දින 10 ක් යාමට පෙර ඔහු විසින් ටෙන්ඩරයකට බැඳීමට අපොහොසත් වුව හොත් ඔහුගේ තැන්පත් මුදල වන රුපියල් 50 රාජසන්තක කරනු ලැබේ.

7. නියම කරණ ලද වැඩ ප්‍රමාණයෙන් සියයට 90 ක් වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 ඉහත 6 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලක් සමග සතුටුදායක අන්දමින් වැඩ නිමකර මාස තුනක් ගෙවී ගියාසින් පසු ගෙවනු ලැබේ.

8. ටෙන්ඩර් සපිරත්වයෙන් යුතු වියයුතු අතර ටෙන්ඩර් ගැන සලකා බැලීම සඳහා ටෙන්ඩර් අවසන් කිරීමෙන් පසු දින 30 ක් නික්මෙන තෙක් ඒවා ඉවත් නොකළ යුතුය.

9. ටෙන්ඩර් එකක් හෝ සියල්ලම, ප්‍රශ්නයක් නොනගාම, ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයන්හි කුමන කොටසක් පිළිගැනීමට හෝ ආණ්ඩුවට බලය තිබේ.

10. වැඩිපුර විස්තර මන්නාරම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 4 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේදී ය.

6–369—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## මාතලේ කච්චේරිය

**කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අනුමත සැලැස්මට අනුකූලව මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නබඩගහවත්ත වසමේ සහ ලග්ගල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මිණිපේ III වැනි පියවරේ 12 යායේ ප්‍රතිසංවිධාන පට්ටි ගැසීමේ මධ්‍යස්ථානවල කම්කරු නිවාස දෙකක් හා පට්ටි ගොනුන් සඳහා ගෙවල් දෙකක් සෑදීම**

ඉහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 1969 ජූලි මස පළමු වැනි දින දහවල් 12 දක්වා මාතලේ ආණ්ඩුවේ ඒජන්ත විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ 1969 ජූනි මස 30 වන දින දහවල් 12 තෙක් මාතලේ කච්චේරියෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රවලය. මෙම ආකෘති පත්‍රයක්, ලබා ගැනීම සඳහා මාතලේ කච්චේරියේදී රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. ග්‍රාමසංවර්ධන සමිති හා සමූපකාර සමිති මෙම ඇප මුදල තැන්පත් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරණු ලැබේ.

3. ටෙන්ඩර්කරුවන් රිසිට් පත් ප්‍රවේසම්ව තබාගෙන ඒවා තැන්පත් මුදල් ආපසු ඉල්වන විටදී ඉදිරිපත් කළ යුතුයි. රිසිට් පත් ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම් පස උඩකෙළවරේ "මාතලේ දිස්ත්‍රික්කයේ පට්ටි ගැසීමේ මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඉදි කිරීම" යින්න සටහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්, ආණ්ඩුවේ ඒජන්ත, කච්චේරිය, මාතලේ, යන ලිපිනයට එවිය යුතුයි. තැපැලෙන් එවනු ලබන්නේ නම් ලියාපදිංචි තැපැලෙන්ම එවිය යුතුයි. නැත හොත් ටෙන්ඩර්කරු විසින් මාතලේ ආණ්ඩුවේ ඒජන්ත ගේ කාර්‍යශීල සහකාර තැනගේ කන්තෝරු කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි. ටෙන්ඩර් පත් බහාලන ලියුම් කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය සටහන් කළ යුතුයි. ටෙන්ඩරයේ කරණු ලබන වෙනස් කිරීම්, කපා හැරීම් ආදිය ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුයි.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසිම වෙනස් කිරීම් වලට භාජන නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට හැකිවන පරිදි ඒවා භාර ගැනීම අවසන් වූ දින සිට දින 21 ක් ගතවන තෙක් ආපසු ගත නොහැක්කේ ය. සාර්ථක ටෙන්ඩර්කරු පිළිගනු ලැබූ ටෙන්ඩරයේ මුළු මුදලින් 5% ක් තැන්පත් මුදලක් වශයෙන් තැන්පත් කළ යුතුයි. මෙම තැන්පත් මුදල කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස නිම කිරීමෙන් මාස දෙකක් ඉක්ම යැමෙන් පසු නිදහස් කරණු ලැබේ.

6. සාර්ථක ටෙන්ඩර්කරු විසින් 1969 සැප්තැම්බර් මස 25 වන දිනට පෙර වැඩ සියල්ල නිම කළ යුතුයි.

7. සාර්ථක ටෙන්ඩර්කරු ඉදි කිරීමේ කටයුතු පැහැර හරින්නේ නම්, ඔහුගේ තැන්පත් මුදල රජය සතු කරණු ලැබේ. තවද, ටෙන්ඩර්කරුගේ නම ද, රජයේ කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරණු ලබන්නේ ය.

8. 1969 ජූලි මස 1 වැනි දින පස්වරු 3ට මාතලේ කච්චේරියේදී ටෙන්ඩර් පත් විවෘත කරණු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

9. ටෙන්ඩර් කරුවන් අඩුම වශයෙන් රු. 20,000 කටවත් රජයේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියා පදිංචි කරණු ලැබූවන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමේදී මෙම ලියා පදිංචි කිරීමට අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර සමිති මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කරණු ලැබේ.

10. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවීම සාර්ථක ටෙන්ඩර් කරු විසින් පුහුණු නුපුහුණු දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතුයි. එම කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරණු ලබන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

11. සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ ටෙන්ඩර් පත්‍රයක් හෝ එහි කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය මාතලේ ආණ්ඩුවේ ඒජන්ත සතුවේ.

12. වැඩි විස්තර මාතලේ කච්චේරියෙන් ලබාගත හැක.

ඇල්. බී. උඳලාගම,
මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කච්චේරිය, මාතලේ.
1969 ජූනි 3 දින.

6–349—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කාක් කපල් ලිය විදුලිබල පෝෂ කර්මාන්ත ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1969 ජූලි 7 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. පහත සඳහන් දෙපාර්තමේන්තුවක රු. 30,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක :—

1. රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
3. දුම්රිය දෙපාර්තමේන්තුව,
4. අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
5. ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉන්ජිනේරු දෙපාර්තමේන්තුව.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1969 ජූලි මස 5 දින පෙරවරු 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබාගත යුතු වේ.

පී. එච්. පී. ද සිල්වා,
අධ්‍යක්ෂක,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

යොමුව : සීජ්/සී/192.
1969 ජූනි 3,
කොළඹ 7.

6–358—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## කච්චේරිය—මඩකලපුව

### කල්ලඩි කලාත්මක පෙහෙකම්හල ව්‍යාප්තකර ගොඩනැගිල්ල තැනීම

මඩකලපුවේ කල්ලඩියේ පිහිටුවා ඇති කලාත්මක පෙහෙකම්හල ව්‍යාප්ත කැරෙන ගොඩනැගිල්ලක් තැනීම සඳහා මුද්‍රා තබනලද ටෙන්ඩර්පත්, මඩකලපුවේ දිසාපති විසින් 1969 ජූනි මස 30 වැනි දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ.

2. මඩකලපු කච්චේරියෙන් ලබාගතහැකි ඉල්ලුම්පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ගොඩනැගිලි තැනීම සඳහා යම්කිසි දෙපාර්තමේන්තුවල ලියාපදිංචිකර සිටින කොන්ත්‍රාත්කරුවන්ට, ඔවුන් කිසියම් කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් තැන්පත් කර, එම කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසු මඩකලපු දිසාපති විසින් 1969 ජූනි මස 27 දින ප. ව. 4 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් තැන්පත් නොමැතිව පහත සඳහන් සමිතිවලට ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති.

(ආ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචිකරන ලද සමුපකාර සමිති.

4. ටෙන්ඩර් පත්‍ර මඩකලපු කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය හැක. එසේ නැත්නම් ලියාපදිංචි කල තැපෑලෙන් එවිය හැක. සියළු ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද ලියුම් කවර තුළ බහා තිබිය යුතු අතර, එම පත්‍රවල සේවාවේ විස්තර, ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුය. සියළු ටෙන්ඩර් පත්‍ර "ආණ්ඩුවේ ඒජන්ත, කච්චේරිය, මඩකලපුව" යන ලිපිනය ලියා එවිය යුතුය.

5. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් දිනයේ, එම වේලාවේ දී ටෙන්ඩර්පත් විවෘත කරන විට, සියළු ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ.

6. වැඩි විස්තර මඩකලපු දිසාපතිගෙන් ලබාගත හැක.

ඩී. නෝසයියා,
මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 4 වැනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දී ය.

6–482—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### පල්ලෙකැලේ එලිමහන් සිරකඳවුරේ ඇති හිස් ගෝනි, හිස් බෝතර සහ ටින් ආදිය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත අත්සන් කරනු ලබන මවිසින් පල්ලෙකැලේ, එලිමහන් සිරකඳවුරේ එකතුවී ඇති මෙහි පහත දක්වෙන හිස් භාජන විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 ජූනි මස 27 දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ :—

| | | |
|---|---|---|
| 1. | හිස් පිටි ගෝනි "ඔරිජිනල්" ... ... | 235 සි. |
| 2. | හිස් පිටි ගෝනි "දැල්" (තනිපට) ... ... | 980 සි. |
| 3. | හිස් පිටි ගෝනි "දැල්" (දෙපට) ... ... | 270 සි. |
| 4. | හිස් සීනි ගෝනි ... ... ... | 25 සි. |
| 5. | ලුණු දැල් ලූණු ගෝනි ... ... | 40 සි. |
| 6. | හිස් ගෝනි (පලුදු සහිත) ... ... | 370 සි. |
| 7. | හිස් බේකරි කොම්පවුන්ඩ් රා : 35 ටින් ... | 199 සි. |
| 8. | හිස් රාත්තල් එකේ ඊස්ට් ටින් (ඉන්ගියුරා හා ඩී. සී. ඇල්.) ... ... ... | 690 සි. |
| 9. | හිස් කුකුල් කෑම මලු ... ... | 225 සි. |
| 10. | හිස් කුකුල් කෑම පලුදු සහිත මලු ... ... | 150 සි. |
| 11. | හිස් කුකුල් කෑම මලු (කුඩා) ... ... | 25 සි. |
| 12. | හිස් සුදු බෝතල් ... ... ... | 500 සි. |
| 13. | හිස් රතු බෝතල් ... ... ... | 84 සි. |
| 14. | හිස් රතු බෝතල් (පැතලි) ... ... | 340 සි. |
| 15. | හිස් භාග බෝතල් රතු පැතලි ... ... | 102 සි. |

ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා මෙම කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 15 ක් තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන ලද රිසිට් පත ටැන්ඩර් පතට ඇමිණිය යුතුයි. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. ටැන්ඩර්කරුවන් විසින් සිය අත් අකුරෙන් ටෙන්ඩර් ලියා ඉදිරිපත් කළ යුතුය. යම් ටෙන්ඩරයක් භාරගත් බව ලිපියකින් දන්වා දින (14) ක් ඇතුලතදී එම ද්‍රව්‍ය වලට මිල ගෙවා ඉවත් කර ගැනීමට නොහැකිවීනම් හෝ ඉවත්කර ගැනීමේ කාර්‍ය පැහැර හැරියේ නම් ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කල මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුලත් කරනු ලැබේ. ටෙන්ඩර් පත පිලිගත් බවට දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවිනි නම් හෝ එම ස්ථානයෙහි තබා ආවේ නම් ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුනු සේ සලකනු ලැබේ. පිලිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමෙන් පසු තැන්පත් මුදල ආපසු දෙනු ඇත.

ටෙන්ඩර්කරුවන් විසින් ද්‍රව්‍ය සියල්ලක්ම සඳහා මුලු තොගය වෙනුවෙන් ඒකාබද්ධ මිලක් සඳහන් කල යුතුය. වැඩිම මිල ඉල්ලුම්කරුට ද්‍රව්‍ය සියල්ලක්ම දෙනු ලැබේ. ටෙන්ඩර්පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචිකල තැපෑලෙන් හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. සෑම ලියුම් කවරයකම වම්පස ඉහල කෙලවරේ "හිස්ගෝනි, හිස් බෝතල ටින් ආදිය සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

සාමාන්‍ය වැඩ කරන දිනයන්හි පූ. භා. 8 සිට 11 සහ අ. භා. 1 සිට 3 දක්වාද, පෙර පෝය දිනයන්හි පූ. භා. 8 සිට 11 දක්වාද පල්ලෙකැලේ, එලිමහන් සිර කඳවුරේ බන්ධනාගාර අධිකාරීගෙන් විමසීමෙන් පසු මෙම භාණ්ඩ පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරයේ යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුයි. විකිණීමට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය තෝරා වෙන්කර ඒ අනුව මිල ගණන් භාරගනු නොලැබේ. සම්පූර්ණ තොගයටම ඒකාබද්ධ මිලක් දැක්විය යුතුය.

ටෙන්ඩර්පත් 1969 ජූනි මස 27 වැනි දින පූ. භා. 10.35 ට පල්ලෙකැලේ එලිමහන් සිර කඳවුරේ බන්ධනාගාර අධිකාරීගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් විය හැක.

වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය වේ නම් පහත අත්සන් කර ඇති අයගෙන් විමසන්න.

ජේ. ව. අබේනායක,
බන්ධනාගාර අධිකාරී.

එලිමහන් සිරකඳවුර, පල්ලෙකැලේ,
කුණ්ඩසාලේ, 1969 මැයි මස 30 දින දීය.

6–370—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමු වන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර ප ත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරිමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. බඩුබාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුල ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12 ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. රෝගීන්ට සහ සේවකයින්ට ආහාර සැපයීමට අවශ්‍ය සහල් ප්‍රමාණය එක් අයකුගේ සලාකයක පදනම් මත කොන්ත්‍රාත්කරුවන් වෙත ඒ ඒ ආයතන භාර නිලධාරීන් මගින් නියෝජ්‍ය ආහාර කොමසාරිස් විසින් සතිපතා ලබා ගැනීමට අවසර පත් නිකුත් කරනු ඇත.

1969 ජූනි මස 4 වැනි දින,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරිගේ කායඨාලයේදීය.

ඒ. බී. එන්. මොහමඩ්,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරී.

## උපලේඛනය

| (1) ආයතන | (3) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට — අළුත් මාළු | හරක් මස් | කරවල | එලවළු | නොගෙවන රෝගීන්ට — අළුත් මාළු | හරක් මස් | කරවල | එලවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නොපිසූ ආහාර සැපයීම : | | | | | | | | | | | |
| ඉහිණියාගල ආරෝග්‍යශාලාව ... | 100... | 800 | | 400... | — ... | 750... | 1,600... | 1,400... | — ... | 2,750... | 5,750 |
| පිසූ ආහාර සැපයීම : | | | | | | | | | | | |
| අම්පාර ආරෝග්‍යශාලාව ... | 100... | 800 | | 190... | 190... | 180... | 700... | 2,950... | 3,050... | 2,930... | 11,550 |
| කාතන්කුඩි ප. ඒ. ... | 100... | 400 | 1969.7.9 දින පෙ.ව. 10ට | 100... | 100... | 100... | 460... | 700... | 850... | 750... | 3,050 |
| මධ්‍ය කඳවුර ප. ඒ. ... | 100... | 600 | | 100... | — ... | 160... | 330... | 450... | — ... | 1,000... | 1,800 |
| සමන්තුරේ ප. ඒ. ... | 100... | 600 | | 350... | — ... | 700... | 1,500... | 500... | — ... | 1,000... | 2,100 |
| වාලච්චේන ප. ඒ. ... | 100... | 800 | | 100... | — ... | 250... | 460... | 1,300... | — ... | 2,600... | 5,150 |

6–477—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ 7, තැ. පෙ. අංක 1434 රේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කායඨාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති තැන විසින් මාම්පිටිය ග්‍රාමීය රෝහලේ බාල්දි වැසිකිලි ජල මුද්‍රා බවට පරිවර්තනය කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 ජූලි මස 8 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 ජූනි මස 27 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ පල්දෝරු ක්‍රම ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ, 'ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 50 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ:—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමූපකාර සංගම් රෙජිස්ට්රාර් තැන විසින් ලියාපදිංචි කොට ඇති සමූපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කායඨාලයේ, ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකි ය. සේවයේ විස්තරද, ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්තරය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමූපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙ රටින් ලබා ගත නො හැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බල පත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එස්. ඒ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 ජූලි මස 3 වන දා,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

6–378—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි 4 වැනි දින පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| අ/හොරොව්පොතාන මහා විද්‍යාලය , | පන්ති කාමර 8 ක දෙමහල් ගොඩනැගිල්ලක් තැනීම. |

සංලක්ෂ්‍යය : අ = අනුරාධපුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 100,000 ට හෝ ඊට වැඩි ගණනකටද, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි 2 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම්, චෙක්පත් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපැලෙන් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 ජූලි 4 වැනි දින පෙ. ව. 10.30 අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. ගුණසේකර,
උතුරු මැද ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 මැයි මස 27 දින,
අනුරාධපුර,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

6–472—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 4 වනදා පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

| | පාසලේ නම | කළයුතු වැඩය | අවශ්‍ය ලියාපදිංචිය |
|---|---|---|---|
| 1. | හ/තංගල්ල මහ විදුහල ... | හස්ථ කර්මාන්තශාලාව ... | රු. 25,000 |
| 2. | හ/යෝදකන්ඩිය මහ විදුහල | හස්ථ කර්මාන්තශාලාව ... | රු. 25,000 |

සංලක්ෂ්‍යය: හ = හම්බන්තොට දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාලයේ රු. 100 (සියය) ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 25,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 3 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නො වෙත්). චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන්ගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැකි ය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි තංගල්ල ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් මාතර, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතු ය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිළිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව මාතර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතු ය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතු ය.

5. 1969 ජූලි මස 4 වන දින ප.ව. 2.30 ට මාතර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමැති විය යුතු ය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරික්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

මාර්ටිනස් වැන්දබෝනා,
හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී,

1969 ජූනි මස 4 වන දින,
තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දී ය.

6–475—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—අනුරාධපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වනද සිට 1970 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික සන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය මේ ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සෑළකියයුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, අනුරාධපුරය " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුව හොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙළ කර ගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් වන කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනන උපලේඛනයෙහි 3 වන තීරසෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරිමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

පි. රත්නසබාපති,
වැඩ බලන සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අනුරාධපුරය, 1969.6.4.

### උපලේඛනය

| | ආයතනය | ටෙන්ඩර් තැන්පත් | ඇප තැන්පත් | ටෙන්ඩර් වසන වේලාව සහ දිනය | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන — සේවකයින් සඳහා | | | | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන — ලෙඩුන් සඳහා | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | | අළුත් මාළු | හරක් මස් | කරවල | එළවළු | අළුත් මාළු | හරක් මස් | කරවල | එළවළු |
| 1. | ගෝමරන්කඩවල ග්‍රාමීය රෝහල ... | 100... | 600... | 69.7.10 පෙ.ව. 10.00 ට | 200... | — ... | 450... | 950... | 350... | — ... | 750... | 1,300 |
| 2. | හොරවපතාන රෝහල ... | 100... | 600... | | 400... | — ... | 800... | 1,600... | 1,100... | — ... | 2,200... | 4,500 |
| 3. | කහටගස්දිගිලිය රෝහල ... | 100... | 800... | | 75... | — ... | 150... | 350... | 1,100... | — ... | 2,200... | 4,000 |
| 4. | කැකිරාව මා. නි. සහ ග්‍රා. රෝ. ... | 100... | 800... | | 200... | — ... | 400... | 1,200... | 1,000... | — ... | 2,000... | 4,000 |
| 5. | කුච්චිවෙලි ග්‍රා. රෝ. ... | 100... | 600... | | 300... | — ... | 600... | 1,400... | 300... | — ... | 500... | 1,000 |
| 6. | මිහින්තලේ රෝහල ... | 100... | 600... | | 200... | 200... | 200... | 800... | 1,200... | 1,000... | 1,200... | 4,800 |
| 7. | මුතූර් රෝහල ... ... | 100... | 600... | | 450... | — ... | 900... | 1,400... | 1,400... | — ... | 2,800... | 5,600 |
| 8. | නෙලුබැව ග්‍රා. රෝ. ... | 100... | 600... | | 350... | 350... | 350... | 1,400... | 700... | 700... | 700... | 3,000 |
| 9. | නොච්චියාගම ග්‍රා. රෝ. සහ මා. නි. ... | 100... | 800... | | 250... | — ... | 500... | 1,000... | 650... | — ... | 1,300... | 2,500 |
| 10. | තම්පලාකමම් ග්‍රා. රෝ ... | 100... | 600... | | 300... | — ... | 650... | 1350... | 1,000... | — ... | 2,000... | 4,000 |
| 11. | යක්කල ග්‍රා. රෝ. ... | 100... | 600... | | 200... | 200... | 200... | 900... | 600... | 600... | 650... | 2,600 |
| 12. | පෙරියකින්නියා ග්‍රා" රෝ. ම. නි. ... | 100... | 800... | | 350... | — ... | 700... | 1,400... | 1,150... | — ... | 2,300... | 4,500 |
| 13. | පදවිය රෝහල ... ... | 100... | 800... | | 900... | 900..., | 900... | 3,600... | 2,300... | 2,300... | 2,300... | 9,200 |

6—464/1—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—අනුරාධපුර කොට්ඨාශය

### කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වනදා සිට 1970 සැප්තැම්බර් 30 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමු වන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව නොපිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුරයෙහි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියමකරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පලාත්වල පිහිටි සෞඛ්‍යසේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරනලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පිටපත් පත්‍ර දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය'', කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත්‍ර භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටැන්ඩර් පෝරමයෙහි, ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

9. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් වන කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

1969 ජුනි 4 වෙනි දින,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය .

පී. රත්නසභාපති,
වැඩ බලන සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය.

### උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් | ඇප තැන්පත් | ටෙන්ඩර් වසන වේලාව සහ දිනය | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සේවකයින් සඳහා | | | | ලෙඩුන් සඳහා | | | |
| | රු. | රු. | | අළුත් මාළු | හරක් මස් | කරවල | එළවළු | අලුත් මාලු | හරක් මස් | කරවල | එළවළු |
| මැදවච්චිය රෝහල ... | 100... | 800... | 10.7.69 ... (උදේ 10 ට) | 400... | 400... | 400... | 1,500... | 2,500... | 2,500... | 2,500... | 10,000 |

6–464/2—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

යොමුව : පීඇස්ඩී. 2/33/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ග්ලිසරින් සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ග්ලිසරින් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) අංක 14,843 දරණ 1969 පෙබරවාරි 28 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,
(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,
(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,
(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර්පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, සිලින්කෝ මන්දිරය කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු 19 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,
(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ, අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්)ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජෙසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

කොළඹ, 1969 ජූනි මස 4 වැනි දින.

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated reqirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Glycerin B. P. .. .. | 28,000 lb. by weight .. | In 1 cwt. drums |
| 2 .. | Liq. Cresol Sap. B. P. .. .. | 9,000 Imperial gallons by volume | In 5 gallon good quality drums |
| 3 .. | Oleum Morrhuae B. P. .. .. | 3,000 Imperial gallons by volume | In 45 gallon new good quality internally coated export drums |

6–468—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඇස්ඩී. 2/22/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අර්ගොමැට්රීන් මැලියේට් ආදිය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් අර්ගොමැට්රීන් මැලියේට් ආදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,843 දරණ 1969 පෙබරවාරි 28 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,
(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,
(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,
(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, සිලින්කෝ මන්දිරය කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු 8 වැනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,
(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ, අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1969 ජූනි මස 3 වැනි දින.

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Injection of Ergometrine Maleate B. P. 0.5 mgm per ml | 425,000 Ampoules .. | In boxes of 100 ampoules |
| 2 .. | Injection of Adrenalin Tartarate B. P. containing the equivalent of 1 in 1,000 in amber coloured multidose Vials | 25,000 Rubber capped 1 fl. oz. vials | In boxes of 10 vials |
| 3 .. | Elixir of Piperazine Citrate (B. P. C. 1963)–Strength–4 mls. (60 minims) of Elixir should contain the equivalent of 500 mgm of Piperazine Hydrate (The label should contain the strength clearly) | 5,000 Imperial gallons by volume | In ½ gallon leak-proof bottles |
| 4 .. | Injection of Chlorpromazine Hydrochloride B. P. 2.5 per cent W/V solution 50 mgm | 65,000 Ampoules .. | In boxes of 500 ampoules |
| 5 .. | Injection of Hydrocortisone Hemissuccinate Sodium each vial containing the equivalent of 100 mgm Hydrocortisone suitable for intravenous use | 175,000 Rubber capped vials | In boxes of 10 vials |
| 6 .. | Injection of Cyclophosphamide each ampoule containing 100 mgm Cyclophosphamide for intravenous use | 9,000 Ampoules .. | In boxes of 10 ampoules |
| 7 .. | Injection of Cyclophosphamide each ampoule containing 200 mgm Cyclophosphamide for intravenous use | 3,000 Ampoules .. | In boxes of 10 ampoules |

6–469—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

යොමුව : පීඇස්ඩී. 2/24/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ප්‍රෝප්ලේවින් හෙමිසල්ෆේට් යනාදිය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රෝප්ලේවින් හෙමිසල්ෆේට් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,786 දරණ 1968 ජනවාරි මස 26 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, සිලින්කෝ මන්දිරය කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු 15 වැනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ, අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Proflavin Hemisulphate B. P. .. .. | 52,000 Grammes .. | In 5 grammes vials |
| 2 .. | White Ointment Boxes nesting included—each sizes 8, 9, 10 and 11 | 4,300 Dozen Nests .. | In any convenient packing |
| 3 .. | Ethyl Chloride B. P. each with Spray nozzle and lever stopper containing 50 cc | 36,000 tubes .. | In boxes of 100 tubes |
| 4 .. | Oxyphenonium Bromide 5 mgm each .. | 450,000 tablets .. | In bottles of 500 tablets |
| 5 .. | Phenindamine Tartarate B. P. 25 mgm .. | 560,000 (sugar coated) tablets | In bottles of 1,000 tablets |
| 6 .. | Nitrofurantine BNF 50 mgm each .. .. | 1,200,000 tablets .. | In bottles of 500 tablets |
| 7 .. | Ephedrine Compund coated tablets each tablet containing the following :<br>Ephedrine Hydrochloride—20mgm (1/3 gr.)<br>Amynophylline B. P.—130 mgm (2gr.)<br>Amylobarbitone B. P. 30 mgm (1/2 gr.) | 2,000,000 tablets .. | In vacuum sealed bottles protected from light suitable for storage and use under tropical conditions in bottles of 1,000 tablets |
| 8 .. | Water for Injection B. P. (Aqua Pro Injectione) 10cc | 1,000,000 Ampoules .. | In boxes of 100 ampoules |

6–470—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඇස්ඩී. 2/20/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඩැරෝස් ද්‍රාවණ යනාදිය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඩැරෝස් ද්‍රාවණ යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,843 දරණ 1969 පෙබරවාරි 28 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර්පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, සිලින්කෝ මන්දිරය කොටසේ අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු 1 වැනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජයයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ, අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට,

කොළඹ, 1969 අප්‍රේල් මස 3 වැනි දින.

SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated reqirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Darrows Solution containing : Sodium Lactate 0.59 per cent. W/V Sodium Chloride 0.4 per cent. W/V Potassium Chloride 0.26 per cent. W/V in water for Injection B. P. suitable for intravenous use with suspension device | 3,500 bottles × 500 cc .. | In any convenient packing |
| 2 .. | Sterile Normal Saline 0.9 per cent. W/V Injection B.P. (Sodium Chloride Injection B. P.) for intravenous drip each bottle with a suspension device | 135,000 Bottles × 500 cc .. | do. |
| 3 .. | Sterile Dextrose Injection B. P. 5 per cent. W/V for intravenous drip each bottle with a suspension device | 400,000 bottles × 500 cc .. | do. |
| 4 .. | Injection of Dextran *Salt free* a 10 per cent. Solution of Dextran in 5 per cent. W/V Solution of Dextrose suitable for intravenous use each with suspension device | 2,000 bottles × 500 cc .. | do. |

6–467—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## මහවැලි ගඟ සංවර්ධනය

### පූර්ව සුදුසුකම් සඳහා කෙරෙන දැන්වීම

මහවැලි ගඟ සංවර්ධනයෙහි I වැනි යෝජනා ක්‍රමයේ I වැනි පියවරට අයත් ප්‍රධාන නිර්මිති ඉදි කිරීමට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා පූර්ව සුදුසුකම් ලබාගන්නා ලෙස ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ලංකාවේ, කොළඹ, මහ ලේකම් කාර්යාලයේ, ලක් රජයේ ඉඩම්, වාරි මාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ඉල්ලා සිටී.

I වෙනි යෝජනා ක්‍රමයෙහි, I වෙනි පියවර විශාල මූලස්ථාන නිර්මිති දෙකකින් යුක්ත වන අතර මේ එක් එක් මූලස්ථාන නිර්මිති වලට පහත විස්තර සඳහන් නිර්මිති යන්ත්‍රාගාර සහ උපකරණ ඇතුලත් වෙයි.

### පොල්ගොල්ල මූලස්ථාන නිර්මිති

**“ ඒ ” කොටස—I හැරවුම් බැම්ම**

මහනුවර අසල පොල්ගොල්ලේ මහවැලි ගඟ හරහා අඩි 480 දිග සාමාන්‍ය උස අඩි 15 වූ ඔමය මුදුනින් යුත් කොන්ක්‍රීට් හැරවීමේ බැම්ම ඉදිකිරීම, එකක් අඩි 15 ක්ද අනෙක අඩි 10 ක්ද ගැඹුරැති කපා හැරීමේ අඩිතාලම් බැම් දෙකක් කලින් සකස් කරන ලද “ ටී ” බාල්ක ඒකකවලින් සෑදූ අඩි 24 පළලැති පාලමක් ඇතුලත් අඩි 53ක් උස ඇති බැම් ඉදිකිරීම. බැම්මට අඩි 40×21 උස වාන් මං දොරටු 10ක් සවිකර අවසාන කිරීම.

**II—හැරවීමේ උමඟ**

අශ්ව ලාඩමේ හැඩය ඇති විෂ්කම්භය අඩි 19.5ක් වූ, අඩි 26,500 උසැති තත්පරයකට ජලය ඝන අඩි 2,000 ගලා යන උමඟ, මෙහි මුළු දිග ප්‍රමාණයත් දළ වශයෙන් සියයට 25 කට කොන්ක්‍රීට් පෝරුව ඇමීම. උමඟට ඇතුල් වීමේ අඩි 133.5 ක් උස අඩි 40 විෂ්කම්භය ඇති, ගලේ කණින ලද රැලි කවාටය සහ උමඟට අවතීර්ණ වන ව්‍යුහය.

**“ බී ” කොටස**

මැගවට් 18ක ධාරිතාවය ඇති “ ටබෝ ඕල්ටනේටර් යුනිට් ” 2ක් සවි කෙරෙන බල මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ සිවිල් ඉංජිනේරු වැඩ, අඩි 13 විෂ්කම්භය වානේ බට (Penstock) ස්විච් අංගනය සහ පහත “ සී ” යටතේ සැපයෙන යාන්ත්‍රික හා විදුලිමය මෙවලම් සැපයුම්කරුවන්ගේ පරිපාලනය යටතේ සවි කිරීම.

**“ සී ” කොටස**

“ ඒ ” සහ “ බී ” යටතේ දැක්වෙන හැරවුම් බැම්ම, උමඟට අවතීර්ණ වන ව්‍යුහය, විදුලිබල මධ්‍යස්ථානය, ස්විච් අංගනය ආදියට අවශ්‍ය විදුලිමය හා යාන්ත්‍රික මෙවලම් සැපයීම සහ එසේ සපයන ලද යන්ත්‍ර සූත්‍ර නිසියාකාර ක්‍රියාකර පෙන්වීම.

### බෝවතැන්න මූලස්ථාන නිර්මිති

**I—හැරවුම් බැම්ම**

හැරවුම් බැම්මේ මුදුන් දිග දල වශයෙන් අඩි 1,000ක් පමණ වනු ඇත. මින් අඩි 600ක් පමණ කොන්ක්‍රීට් ගුරුත්ව ගණයේ වන අතර ඉතිරි කොටස පස් පිරවූ බැම්මකින් සමන්විත වෙයි. බැම්මේ උපරිම උස අඩි 100 ක් පමණ වනු ඇත. ජල ප්‍රවාහක කොටසේ මස්තකය අඩි 36× අඩි 14ක් උස ආරුක්කු දොරටුවලින් පාලනය වන්නේ ය.

**II—හැරවීමේ උමඟ**

**අඩි 1,200 ක් දිග පිවිසුම් ඇලක් සහිත අඩි 13.2 ක් විෂ්කම්භය ඇති අඩි 25,000 දිග අශ්ව ලාඩමේ හැඩයෙන් යුත් පෝරු රහිත උමඟ,** තත්පරයට ඝන අඩි 1,000ක ජල කඳක් යැවීමට අඩි 4,200ක් දිග කොන්ක්‍රීට් පෝරු ඇමූ යටි ඇලක් සහ උමඟට ඇතුළුවන නිර්මිතිය, යටි ඇල කෙලවරේ කලාවැවට සහ කන්දලම වැවට ජලය බෙදා යැවීම සඳහා දිය බෙදුම් නිර්මිතියක්.

**III—කන්දලම ඇල**

කන්දලම වැව කරා තත්පරයකට ජලය ඝන අඩි 145ක් යැවීමට පත්ල අඩි 10ක් පළල සැතපුම් 4ක් දිග පෝරු රහිතවූ පසේ කැණුනු ඇලක් සහ අදාල හරස් ජල අපවහන නිර්මිතියක්.

IV—ඉහත සඳහන් කරන ලද බෙදුම් වේල්ල සහ උමඟට ඇතුළු වන නිර්මිතිය සමීපයෙහි සවි කෙරෙන යාන්ත්‍රික හා විදුලිමය මෙවලම් සැපයීම, ඉදිකිරීම, පරීක්ෂා කිරීම සහ ඒවා නිසියාකාර ක්‍රියා කර පෙන්වීම. ඇමෙරිකානු ඩොලර් 1,50,00,000 කට වැඩි මුළු කොන්ත්‍රාත් අගය ඇතැයි ඇස්තමේන්තු කර තිබෙන පොල්ගොල්ල හැරවුම් බැම්මට අයත් වැඩ කොන්ත්‍රාත් 3ක් යටතේ ඉදි කෙරෙනු ඇත. ප්‍රමාණය අනුව දළ වශයෙන් ඒවා අමෙරිකානු ඩොලර් 25 ලක්ෂයේ සිට කෝටිය දක්වා වනු ඇත. මෙම වැඩ ඉදි කිරීම හා යාන්ත්‍රික සහ විදුලිමය මෙවලම් සැපයීම හා සවි කිරීම සඳහා 1969 අගෝස්තු/සැප්තැම්බර් වන විට ටෙන්ඩර් කැඳවීමට බලාපොරොත්තු වනු ලැබේ.

මුළු කොන්ත්‍රාත්තුව අමෙරිකානු ඩොලර් 80 ලක්ෂය ඉක්මවා ඇස්තමේන්තු කර ඇති බෝවතැන්න හැරවුම් වැඩ ඉදිකිරීම සඳහා 1970 ජනවාරි පමණ වන විට ටෙන්ඩර් කැඳවීමට අදහස් කරනු ලැබේ.

ඉහත සඳහන් වැඩ ඇතුලත් මහවැලි ගඟ සංවර්ධනයෙහි I වෙනි යෝජනා ක්‍රමයේ I වෙනි පියවරෙහි වියදම් දැරීම සඳහා පුනර් නිර්මාන හා සංවර්ධනය පිළිබඳ වූ ජාත්‍යන්තර බැංකුවෙන් ලක් රජය ණය මුදලක් ඉල්ලා ඇත. මෙම ණය මුදල අනුමත කරනු ලැබුව හොත් ඉන් ලැබෙන අරමුදල් පූර්ව සුදුසුකම් සඳහා නිකුත් කෙරෙන මෙම ආරාධනය යටතේ කෙරෙන කොන්ත්‍රාත් වැඩවලට ගෙවීම සඳහා යොදාගනු ලැබේ.

යෝජිත කොන්ත්‍රාත්වලට ඇතුලත් නියත හා විශාල ඉදිකිරීම් වැඩ පිළිබඳ පළපුරුද්දක් ඇති පුනර් නිර්මාණය හා සංවර්ධනය පිළිබඳ වූ ජාත්‍යන්තර බැංකුවෙහි සාමාජික රටවල සහ ස්විට්සර්ලන්තයේ කොන්ත්‍රාත්කරුවන් පූර්ව සුදුසුකම් ලබා ගැනුමට සුදුස්සෝ වෙති. ඒකාබද්ධ ඉදිරිපත් වීම් වලටද ඉඩ දෙනු ලැබේ.

ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත්කරුවන්ගෙන්, ඔවුන්ගේ පූර්ව සුදුසුකම් ලියවිලි සඳහා ඉල්ලුම් පත් සහ අතිරේක තොරතුරු පහත සඳහන් ලිපිනයට ලියා දන්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ :—

වාරිමාර්ග අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ලංකාව.

විදේශීය රටවල සිටින ලක් රජයේ නියෝජිතවරුන්ගේ කායර්‍යාල වලදීද මෙම ලියකියවිලි පරීක්ෂා කර බැලීමට පිළිවන.

සම්පූර්ණ කරන ලද පූර්ව සුදුසුකම් පිළිබඳ ලියවිලි 1969 අගෝස්තු 1 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

**ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති,**
**ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය,**
**ලක් රජය.**

**6–521—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය**

## ලංකා ගමනාගමන මණ්ඩලය

**පාවිච්චි කරන ලද ගර්හිත ඇන්ජින් විකිණීම—අපහරණ අංශය, වේරහැර**

වේරහැර බොරලැස්ගමුවේ, ලංගම අපහරණ අංශයේ තිබෙන පාවිච්චි කරන ලද ගර්හිත ඇන්ජින් මිළයට ගෙන හැරගෙන යාම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

බෙඩ්ෆඩ්, පර්කින්ස්, ගයි, ඒ.ඊ.සී., ලේලන්ඩ්, ඉන්ටර්නැෂනල්, කෙලමෝ, ඩොජ්, කොමර්, පෝඩ් වී 8, කොමර්ෂල්, මොරිස් කොමර්ෂල්, ඇවර්ලේ, බී.ඇම්.සී. ඔස්ටින් යනාදි වර්ගවල ඇන්ජින් මේ තොගයට අයත් වේ.

ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දිනයට පෙර දින දවල් 12 වන තෙක් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්මය පිටපත් දෙකකින් යුක්තකොට මුද්‍රා තබා එවිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් මුදලින් රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

1969.7.8 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලැබේ.

සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුළ වේරහැර අපහරණ අංශයේදී මෙම ඇන්ජින් පරීක්ෂා කළ හැකිය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5.

6–454—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

නාගොඩ කලවැල්ලාව-බෙල්ලපිටිය පාරේ අංක 15/4 දරන පාලමේ පිවිසීම් මාර්ගය පිරවීම සඳහා පස් කියුබ් 1,300ක් සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත් කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ජූනි මස 25 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාරගනු ලැබේ.

2. රත්මලාන රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැක.

3. ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 ජූනි මස 28 වැනි බදාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇස්. නාගලින්ගම්,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉන්ජිනේරු වෙනුවට.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කායසීලය,
ර. වැ. දෙ., රත්මලාන,
1969. 5. 20.

6–350—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ගල්ගමුව පොලිස් ස්ථානයට සහ නිවාස වලට බාහිර ජල සම්පාදනය සහ කසල කානුව සඳහා වූ ටෙන්ඩර් පත්, ර. වැ. දෙ. අධිකාරි ඉංජිනේරු කාර්යාලය, කුරුණෑගල ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ජූලි මස 4 වැනි සිකුරාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මහව රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ/විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියළු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිවන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 66,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 ජූනි මස 25 වැනි බදාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියළු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර නිකුත්කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දී හෝ තැන්පත් කළ හැක.

ඇස්. ගනේෂරත්නම්,
අධිකාරී ඉංජිනේරු.

ප්‍රධාන අධිකාරී කාර්යාලය,
ර. වැ. දෙ., කුරුණෑගල,
1969. 6. 5.

6–473—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**ටෙන්ඩර් දැන්වීමක් අවලංගු කිරීම**

තලෙයිමන්නාරමේ ජේගු නිවාස 3 ක එකතු කිරීම් හා වැඩිදියුණු කිරීම් ඇතුළු ආරක්ෂක බැම්ම සහ මායිම් තාප්පය තැනීම සඳහා 1969 මැයි 30 වැනි දිනැති අංක 14,856 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ 891 වැනි පිටුවේ පළ කර ඇති ටෙන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1969. 6. 4.

6–481—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ල. දු. දෙ. ගල්අඟුරු ටොන් 30,000ක් සැපයීම සඳහා 69.5.15 දින අංක 14,854 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම සම්බන්ධයෙනි. එහි පළමුවන ඡේදයේ අන්තිම ජේළිය පහත සඳහන් පරිදි වෙනස් විය යුතුය :—

"අගෝස්තු 15 වැනි දින සිට" යන වචන වෙනුවට "දුම්රිය දෙපාර්තමේන්තුවට අප්‍රමාදව ගල්අඟුරු අවශ්‍යව ඇති බැවින් 1969 ජූනි මස 25 වැනි දින සිට හෝ විකල්ප වශයෙන් ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට ඉක්මණින්ම පළමුවන අඟුරු තොගය කොළඹට සැපයිය හැකි දිනය සඳහන් කළ යුතුය."

එම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1969 ජූනි 8 දා,
කොළඹ දී ය.

–525—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලසීමාව තුල—

(අ) අම්පාරේ හා සිලාවතුරේ පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට එළවලු සහ පලතුරු, මස් වර්ග හා අලුත් මාලු සැපයීම ;

(ආ) තල්ලාඩි (මන්නාරම) හා තොඩ්ඩවෙලි (මන්නාරම) පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට එළවලු, පළතුරු සහ මස් වර්ග සැපයීම ;

(ඇ) තල්ලාඩි (මන්නාරම) හා තොඩ්ඩවෙලි (මන්නාරම) පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට අලුත් මාලු සැපයීම ;

සඳහා 1969 ජූලි මස 3 වෙනි දින පෙරවරු 10 දක්වා කොළඹ, බාලදක්ෂ මාවත (පහළ වැව පාර), යුද හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා යුද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත පූර්වෝක්ත එක් එක් සැපයීම් සඳහා නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාර ගනු නොලැබේ) තැන්පත් කර සිටිය යුතුය. සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත් 1969 ජූලි මස 2 වෙනි දින දහවල් 12 දක්වා යුද හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර කොළඹ, බාල දක්ෂ මාවත (පහල වැව පාර), යුද හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුද ආඥපති.

1969 ජූනි මස 5 වෙනි දින,
යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.

6–439/1—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාල සීමාව තුල අංක 3 වෙනි කඳවුර, විරුක් අංක 18 දරණ ල.යු.පු.බ. කාරියකරවන බළසේනා මූලස්ථානය—කන්තලේ, යාපනය, අයියකච්චි හා මුලතිව් පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට එළවලු සහ පළතුරු, මස් වර්ග හා අලුත් මාලු සැපයීම සඳහා 1969 ජූලි මස 1 වෙනි දින පෙරවරු 10 දක්වා කොළඹ, බාල දක්ෂ මාවත (පහල වැව පාර), යුද හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා යුද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත ඉහත සඳහන් සැපයීම් සඳහා නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාර ගනු නොලැබේ) තැන්පත් කර සිටිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත්‍රිකා 1969 ජූනි මස 30 වෙනි දින දහවල් 12 තෙක් මූලස්ථානය විසින් නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර කොළඹ, බාල දක්ෂ මාවත (පහල වැව පාර), යුද හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුද ආඥපති.

1969 ජූනි මස 5 වෙනි දින,
යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.

6–439/2—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලසීමාව තුල :—

(අ) කොළඹ සහ දියතලාවේ පිහිටා ඇති යුද හමුදාව, රාජකීය ලංකා නාවික හමුදාව හා රාජකීය ලංකා ගුවන් හමුදාව කඳවුරුවලට හා පනාගොඩ සහ කටුකුරුන්ද පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට එළවලු සහ පළතුරු සැපයීම.

(ආ) කොළඹ සහ දියතලාවේ පිහිටා ඇති යුද හමුදාව, රාජකීය ලංකා නාවික හමුදාව හා රාජකීය ලංකා ගුවන් හමුදාව කඳවුරුවලට හා පනාගොඩ සහ කටුකුරුන්ද පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට මස් වර්ග සැපයීම.

(ඇ) දියතලාවේ පිහිටා ඇති යුද හමුදාව, රාජකීය ලංකා නාවික හමුදාව හා රාජකීය ලංකා ගුවන් හමුදාව කඳවුරුවලට සහ පනාගොඩ හා කටුකුරුන්ද පිහිටා ඇති යුද හමුදා කඳවුරුවලට අලුත් මාලු සැපයීම.

සඳහා 1969 ජූලි මස 27 වෙනි දින පෙරවරු 10 දක්වා කොළඹ බාලදක්ෂ මාවත (පහළ වැව පාර) යුද හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා යුද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත පූර්වෝක්ත එක් එක් සැපයීම් සඳහා නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාර ගනු නොලැබේ) තැන්පත් කර සිටිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත් 1969 ජූනි මස 26 වෙනි දින දහවල් 12 දක්වා යුද හමුද මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර කොළඹ බාල දක්ෂ මාවත (පහල වැව පාර) යුද හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුදා ආඥපති

1969 ජූනි මස 5 වෙනි දින,
යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.

6–439/3—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ආරෝහණ වාරිමාර්ග ව්‍යාපාර උදෙසා යන්ත්‍ර හා ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්

| විෂය අංකය | විස්තරය | ප්‍රමාණය | ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ටෙන්ඩර්වල මුදල රු. ශ. |
|---|---|---|---|---|---|
| 1 | පොම්ප 4″ | 20 | 18 | සීමාසහිත වැන්රෝයි | 94,028 20 |
| 2 | පොම්ප 6″ | 46 | 18 | කොන්ට්‍රැක්ටස් ඇන්ඩ් සප්ලයිස් සමාගම | 4,72,051 71 |
| 3 | පොම්ප 8″ | 16 | 17 | එම | 2,36,690 27 |
| 4 | රෝටරි වෝටර් මීටර් 4″ | 20 | 17 | ඉක්විප්මන්ට් ට්‍රේඩ්ස් | 7,935 84 |
| 5 | රෝටරි වෝටර් මීටර් 6″ | 46 | 16 | එම | 24,728 22 |
| 6 | රෝටරි වෝටර් මීටර් 8″ | 15 | 17 | එම | 16,394 40 |
| 7 | ග්ලෝබ් වැල්ව් 4″ | 20 | 14 | සීමාසහිත ඇලෙක්සැන්ඩර් ප්‍රයිවේට් | 3,249 25 |
| 8 | ග්ලෝබ් වැල්ව් 6″ | 46 | 14 | එම | 14,764 28 |
| 9 | ග්ලෝබ් වැල්ව් 8″ | 15 | 13 | එම | 8,784 86 |
| 10 | රිජිඩ් පී.වී.සී. පයිප්ප 4″ | අඩි 19,000 | 11 | ඇන්ග්ලෝ ඊස්ටර්න් කොම්පැණිය | 5,75,254 13 |
| 11 | රිජිඩ් පී.වී.සී. බෙන්ඩ් 4″ | 48 | | | |
| 12 | රිජිඩ් පී.වී.සී. වැල්ව් 4″ | 48 | | | |
| 13 | ටේපර්ඩ් පී.වී.සී. කෝර් 4″ | කුට්ටම් 60 | | | |
| 14 | ස්ටීල් ටේපර්ඩ් ෆ්ලාන්ජ් 4″ | කුට්ටම් 60 | | | |
| 15 | රිජිඩ් පී.වී.සී. පයිප්ප 6″ | අඩි 55,000 | | | |
| 17 | රිජිඩ් පී.වී.සී. බෙන්ඩ් 6″ | 132 | | | |
| 18 | ටේපර්ඩ් පී.වී.සී. කෝර් 6″ | කුට්ටම් 250 | | | |
| 16 | ස්ටීල් ටේපර්ඩ් ෆ්ලාන්ජ් 6″ | කුට්ටම් 250 | | | |
| 19 | රිජිඩ් පී.වී.සී. පයිප්ප 8″ | අඩි 20,000 | | | |
| 20 | රිජිඩ් පී.වී.සී. බෙන්ඩ් 8″ | 48 | | | |
| 21 | ටේපර්ඩ් පී.වී.සී. කෝර් 8″ | කුට්ටම් 90 | | | |
| 22 | ස්ටීල් ටේපර්ඩ් ෆ්ලාන්ජ් 8″ | කුට්ටම් 90 | | | |
| 23 | සෝල්වන්ට් සිමෙන්ති (ග්‍රෑම් 500 ටින්) | 280 | | | |
| 24 | ට්‍රැක්ටර් (සැහැල්ලු පන්තිය) | 2 | 7 | සීමාසහිත පෞඩන්බර්ග් සහ සමාගම | 1,29,084 04 |
| 25 | ට්‍රැක්ටර් (මධ්‍යම පන්තිය) | 2 | 6 | එම | 2,74,771 09 |
| 26 | ටොන් 5 ඩීසල් ලොරි | 9 | 7 | සීමාසහිත වෝකර් පුත්‍ර සමාගම | 1,93,545 81 |
| 27 | ෆෝර් වීල් ඩ්‍රයිව් ලෑන්ඩ් වෙහිකල් | 6 | 2 | සීමාසහිත යුනයිටඩ් මෝටර්ස් | 75,166 90 |
| 28 | ෆෝර් වීල් ඩ්‍රයිව් ස්ටේෂන් වැගන් | 2 | 2 | සීමාසහිත පෞඩන්බර්ග් සහ සමාගම | 33,045 63 |
| 29 | පෝර්ට්ලන්ඩ් සිමෙන්ති (සාමාන්‍ය) | ටොන් 11,000... | ටැන්ඩර් පත් ලැබුණේ නැත. | | |

එල්. ඕ. ද එස්. ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 7,
1969 ජූනි මස 4 වැනි දින දීය.

6-343—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය තොගයක් 1969 ජූනි මස 30 වැනි දින පෙ. ව. 10 ට කටුනායක කන්කසන්තුරයේ යාපන ගුවන් තොටුපලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකුණනු ලබන දින පෙ. ව. 9 සිට මෙම බඩු බාහිරාදිය පරීක්ෂා කර බැලීම පිණිස තබනු ලබනවා ඇත. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, කොළඹ 1 යන ලිපිනයට ඉල්ලුම් පතක් එවීමෙන් හෝ කන්කසන්තුරයේ සහකාර ගුවන් තොටුපල කොමඩාන්ට් වෙතින් හෝ මෙම බඩු බාහිරාදියේ ලැයිස්තුවක් ලබාගත හැකිය.

3. මිලදී ගනු ලබන බඩු බාහිරාදිය සඳහා එම ස්ථානයේදීම මුදල් ගෙවිය යුතු වන අතර බඩු බාහිරාදිය එදින පස්වරු 4.30ට පෙර ඉවත් කර ගත යුතුය.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1969.6.6,
සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව,
කොළඹදීය,

6-466—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## පලාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### පරණ ගොඩනැගිලි ද්‍රව්‍ය වෙන්දේසියක්

වර්ෂ 1969 ජූනි මස 20 වැනි දින පෙරවරු 10 ට පහත සඳහන් පරණ ගොඩනැගිලි ද්‍රව්‍යය, කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ පිහිටි මාලිගාවත්ත සංවර්ධන යෝජනා ක්‍රමයේ භූමියෙහි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉස්තෝප්පු ලී කනු, ජනෙල් රාමු, උළුවහු, ජනෙල් සහ උළුවහු දොරවල්, දොර හා ජනෙල් පියන්, ගැල්වනයිස් පීලි තහඩු, යකඩ කෑලි, වානේ කෑලි, යකඩ ගේට්ටු, "එච්" යකඩ ආදිය.

වෙන්දේසියට පෙරදින එකී ද්‍රව්‍යය පරීක්ෂා කිරීමට ඉඩදෙනු ලැබේ. වෙන්දේසිය අවසානයේ ලබාගත් ද්‍රව්‍යවලට මුදල් ගෙවා එම ද්‍රව්‍යය ගෙනයාමට හැකිවේ.

එන්. ගුණරත්න,
නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ.

නගර හා ග්‍රාම නිර්මාණ අංශය,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ. 10,
1969.6.6.

6-476—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය

### වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 1969 ජූනි 28 වැනි දින පස්වරු 1.15 ට කොළඹ 2, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශ කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ලී අල්මාරි 5
ලී අල්මාරි කෑලි 2
පොත් අල්මාරි 1
හම් බෑග් 2
පරණ කාර් බැටරි 5
බෙඩ්කින් 1
බාල්දි 1
කැමරා 1
කාර් අමතර කොටස් ගොඩක්
මුදල් පෙට්ටි 6
අත් පුටු 44
ජී. ඕ. එච්. පුටු 5
පුටු (සාමාන්‍ය) 31
කබඩ් 1
ආකෘති පත්‍ර තබන කබඩ් 1
කුඩු දෙකේ වීදුරු තීන්ත කුඩු 9
කුඩු එකේ වීදුරු තීන්ත කුඩු 1
බයිසිකල් ලාම්පු 1
යකඩ ඉබ්බො 19
පෑන් රාක්ක 1
ලී කෑලි ගොඩක්
සනීපාරක්ෂක ආසන සහ ගැලුන් දෙකේ වතුර ටැංකි 2
සිල් හතරේ විදින යන්ත්‍ර 2
සිල් එකේ විදින යන්ත්‍ර 1
කුඩු වෙන් කළ රාක්ක 1
මී කතුරු 2
රබර් මුද්‍රා 30
ඇස්බැස්ටෝස්තහඩු 35
කාර්යාල මේස 23
යතුරු ලියන මේස 5
දුල සහ කණු සහිත ටේබල් ටෙනිස් මේස 1
ටෙන්ඩර් පෙට්ටි 1
පාවිච්චි කළ ටියුබ් 4
පාවිච්චි කළ ටයර් (5) 12
යතුරු ලියන 4
ගැල්වනයිස් කම්බි රෝල් 2
ලී ස්ක්‍රීන් 4
වීදුරු සහිත ලී දොරවල් 4
ලී කුඩා ස්ක්‍රීන් 1

ඉල්ලීම සාර්ථක වූ ඉල්ලුම්කරු විසින් වටිනාකම සම්පූර්ණයෙන් ගෙවා වහාම භාණ්ඩය රැගෙන යා යුතුය.

ඉහත සඳහන් භාණ්ඩ වෙන්දේසි දිනට කලින් දිනයේදී කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ කාර්යාලයේදී පෙරවරු 9.30 සිට පස්වරු 4 දක්වා පරීක්ෂාකර බැලිය හැක.

ජේ. වී. පොන්සේකා,
ස්ථිර ලේකම්,
කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය.

1969 ජූනි 3 දින,
කොළඹදීය.

6–487—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### පරණ ලී බඩු සහ ගෘහ භාණ්ඩ විකිණීම

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, කටුනායක පිහිටි සැපයීම් සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ තිබෙන පරණ ලී බඩු සහ ගෘහ භාණ්ඩ විකිණීම සඳහා 1969 ජූනි මස 26 වැනි දින පෙරවරු 10 වන තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත් ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත, නැවත ලබා ගත හැකි රු. 100 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1969 ජූනි මස 25 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර්පත් නිකුත් කෙරේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාපති.

1969.6.2.

6–352—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බටහිර දිසාවේ දැව වෙන්දේසිය

හඳපාන්ගොඩ කුරණ රාජ්‍ය දැව සංස්ථා ගබඩාවේ ඝන අඩි 375.8 යුත් විවිධ ප්‍රමාණයේ බඩදෙල්, මිල්ල සහ දුන් කඳන් 27 යුත් දැව තොග හයක් බටහිර දිසාවේ දිසා වන නිලධාරී 1969. 6. 21 දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම දැව වෙන්දේසි කිරීමට ප්‍රථම පරීක්ෂාකර බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වැඩි විස්තර බටහිර දිසාවේ දිසා වන නිලධාරීගෙන් හෝ කුරණ රා. දැ. ස. ගබඩාවේ ගබඩා පාලකගෙන් ලබාගත හැකිය.

ඇස්. ඇන්. ශූ. ප්‍රනාන්දු,
බටහිර දිසාවේ දිසා වන නිලධාරී.

දිසා වන කාර්යාලය,
රත්නපුර.

6–381—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඇලබද ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 ජූනි මස 24 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 ජූනි මස 23 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

1. මාළුකටු පෙට්ටි ගොයයක් (අඩුගා එකතු කළ)
2. හුණු ගෝනි 48 යි (පලුදු සහිත)

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොයියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම්/4
1969 ජූනි මස 4 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

6–348—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## බදුල්ල දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ රා තැබෑරුම් විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා 1969 මාර්තු මස 21 වැනි දින අංක 14,846 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969–70 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡෙදයන් සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසිවලටද, දනට බලපවත්නා සියලු සුරා බදු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 1969 ජූලි මස 3 වන දින තෙක් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

2. රා රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත් වන අය ලංකාවේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි ආකාර සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙහි නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කච්චේරි කුවිතාන්සියද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක්ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය හා නමද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි පහත දක්වෙන ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමෙන් හෝ මෙම කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිසාපතිතුමා වෙත ලැබීමට සැලැස්විය යුතුයි.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරණු ලබන සෑම වෙනස් කිරීමක් ම හෝ සංශෝධනයක් ම ටෙන්ඩර් කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුයි. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 1969 ජූලි මස 3 වැනි දින පෙරවරු 9.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියේ පෙනී සිටිය යුතුයි.

5. කිසියම් කරුණක් සඳහන් නොකොට, ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති තුමා සතුවේ.

6. ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ අය, ඔහු ගැනුම්කරු වශයෙන් ප්‍රකාශිත දින සවස 4ට පෙර දිසාපතිතුමා විසින් නියම කරනු ලබන මාස දෙකකට නොඅඩු කාලයක බදු මුදලක් තැන්පත් ඇප වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තැබිය යුතුයි.

7. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමේදී දනගතයුතු වෙනත් විස්තර ඇත්නම් බදුල්ල කච්චේරියෙන් ලබාගත යුතුයි.

ඩබ්. තිලකරත්න,
අතිරේක දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969, ජූනි මස 1 වෙනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේදී.

### ඉහත කී තැබෑරුම්වල උපලේඛනය

**අනුමත කරනලද තැබෑරුම් ලැයිස්තුව, බදුල්ල දිස්ත්‍රික්කය**

| තැබෑරුමේ අංකය සහ නම | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාශය | තැබෑරුම් විවෘත කරන වේලාව පෙරවරු | වසන වේලාව පස්වරු | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් වසන වේලාව පෙරවරු |
|---|---|---|---|---|---|---|
| 1. බදුල්ල ... | බදුල්ල මහ නගර සභාව | බදුල්ල මහ නගර සභාවේ අංක 6 දරන කොට්ඨාශයේ සීමාව තුළ | 8.00 ... | 7.30 ... | 1,000 ... | 10.00 |
| 2. ලුනුගල ... | පස්සර ... | ලුනුගල නගරයේ පිහිටි වරිපනම් අංක 219 දරණ කුරුවිකුඹුරේවත්ත. | 8.00 ... | 7.30 ... | 250 ... | 10.30 |

**බදුල්ල දිස්ත්‍රික්කයේ වතු සුරා සැල් (රා) ලැයිස්තුව (ටෙන්ඩර් පත් ඉදිරිපත් නොකළ යුතුය)**

1. මඩුල්සීම—මහාදෝව වත්තේ සීමාව තුල.
2. ලුනුගල—කෙහෙල් වත්තේ වතුයාය සීමාව තුල.
3. තලිපොතැන්න—තලිපොතැන්න වතුයාය තුල.

6–359—69.6.13 දින අංක 14,858 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 69. 6. 6 සිකුරාද | ... | 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.13 සිකුරාද | ... | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.20 සිකුරාද | ... | 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | | 69 6.27 සිකුරාද | ... | 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | ... | 69. 7. 4 සිකුරාද | ... | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.11 සිකුරාද | ... | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.18 සිකුරාද | ... | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.25 සිකුරාද | ... | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... | 69. 8. 1 සිකුරාද | ... | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8. 8 සිකුරාද | ... | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.15 සිකුරාද | ... | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.22 සිකුරාද | ... | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.29 සිකුරාද | ... | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
වැඩ බලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණදෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි